

2022

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

கொழும்பு பல்கலைக்கழக உயிர் இரசாயனவியல், மூலக்கூற்று உயிரியல் மற்றும் உயிர் தொழில்நுட்பவியல் நிறுவகம்

Institute of Biochemistry, Molecular Biology and Biotechnology, University of Colombo

ආවර්ජනා

ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය කොළඹ විශ්වවිද්‍යාලය

2022

















දැක්ම

"අණුක ජීව විද්‍යා
ක්ෂේත්‍රයෙහි
අන්තර්ජාතික විශිෂ්ට කේන්ද්‍රස්ථානයක්
බවට පත් වීම"

මෙහෙවර

ජාතික සහ අන්තර්ජාතික
සංවර්ධනය
ළඟා කර ගැනීමටදෙසා
අණුක ජෛව විද්‍යාවන්හි
උසස් පර්යේෂණ සහ
මානව සම්පත් සංවර්ධනය

ඇරඹුම

ප්‍රවර්ධනය

සුසාධ්‍යකරණය

ආයතනික සාරධර්මයන්

ශාස්ත්‍රීය නිදහස

ආයතනයේ සම්මතයන් හා ප්‍රමිතීන්ට යටත්ව,
සත්‍යය සහ අවබෝධය අනුගමනය කරමින් බාධාවකින් හෝ දණ්ඩනයකින් තොරව පර්යේෂණ පැවැත්මට, ඉගැන්වීමට, භාෂණයට සහ ප්‍රකාශයට පත් කිරීමට නිදහස තිබේ.

යාවජීව ඉගෙනීම සහ විචාරාත්මක චින්තනය

ආයතනය කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ යාවජීව ඉගෙනීම සහ විචාරාත්මක චින්තනය පුබුදු කරයි.

නවෝත්පාදනය සහ ගවේෂණය

සංවර්ධනය සඳහා නවාංග සොයා ගැනීමට ආයතනය සැමවිටම සුදානමින් සිටී.

වගකීම සහ වගවීම

ආයතනය වගකීම සහ වගවීම පිළිබඳ හැඟීමකින් යුතුව ක්‍රියාත්මක වේ.

විවිධත්වය සහ අන්තර්ග්‍රහණය

ආයතනය පුළුල් පරාසයක් හරහා අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර අන්තර්ග්‍රහනය වර්ධනය කරයි.

අඛණ්ඩතාවය

ආයතනයේ සාධනයන් එහි ක්‍රියාවන්හි විනිවිදභාවය සහ ක්‍රියාකාරිත්වයේ අඛණ්ඩ බව මත පදනම් වේ.

වෘත්තීයමය බව

ආයතනය සියලු සිසුන් සහ කාර්ය මණ්ඩලය වෙතින් අවංකභාවය, සදාචාරය, නීක්ෂණ අවධානය සහ අනුකූලතාව අපේක්ෂා කරයි.

කැපවීම සහ නිපුණතාවය

ආයතනයේ කාර්ය මණ්ඩලය දැනුම වර්ධනය කිරීමට, දැනුම ලබා දීමට සහ අතිශය උනන්දුවෙන් වැඩ කිරීමට කැපවී සිටියි.

කණ්ඩායම් හැඟීම

කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ කීර්ති නාමයක් සහිත මෙම ආයතනය එහි සියලු කටයුතුවලදී කණ්ඩායම් හැඟීම වර්ධනය කරයි.

සම අවස්ථා

තම ශක්තිය හා එකමුතුකම ලැබෙන්නේ සැමට සම අවස්ථා හා සමානතාවය ලබාදීම මත බව ආයතනය පිළිගනී

අරමුණු

අරමුණු අංක 1

අණුක ජීව විද්‍යාව සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල ඉහළ මට්ටමේ ජාත්‍යන්තරව පිළිගත් අභ්‍යාසලාභීන්, උපාධිධාරීන් සහ පශ්චාත් උපාධිධාරීන් බිහි කිරීම

අරමුණු අංක 2

ජාතික සංවර්ධනයට දායක වන පෙළඹ රසායන විද්‍යාව, අණුක ජීව විද්‍යාව, පෙළඹ තාක්ෂණය, පෙළඹ තොරතුරු, ජාන, සෛල ජීව විද්‍යාව සහ ප්‍රතිශක්තිවේදය පිළිබඳ විශිෂ්ට මධ්‍යස්ථානයක් වීම

අරමුණු අංක 3

යටිතල පහසුකම් සහ මානව සම්පත්වල විශිෂ්ටත්වය ළඟා කර ගැනීම

අරමුණු අංක 4

යටිතල පහසුකම් සහ මානව සම්පත්වලින් විශිෂ්ටත්වය ළඟා කර ගැනීම

අරමුණු අංක 5

යහපාලනය ප්‍රවර්ධනය කිරීම

පටුන

1 අධ්‍යක්ෂකතුමාගේ සමාලෝචනය
2 IBMBB ආයතනයේ අධ්‍යක්ෂවරු
3 IBMBB පිළිබඳ හැඳින්වීම
5 ආයතනික ව්‍යුහය
6 පාලනාධිකාරිය
7 අධ්‍යයන හා ඉගැන්වීම්
7 පශ්චාත් උපාධි පාඨමාලා
9 ප. උපාධි ප්‍රදානෝත්සවය 2022
10 කෙටිකාලීන පාඨමාලා සහ පුහුණු වැඩසටහන්
13 පර්යේෂණ ක්‍රියාකාරකම්
25 පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂණ
25 පර්යේෂණ පළකිරීම්
28 පර්යේෂණ සන්නිවේදන
32 ජාත්‍යන්තර පර්යේෂණ අරමුදල්
32 ක්වීන් එලිසබෙත් පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන
33 IBMBB - සේවා
34 සහයෝගිතාවයන්
35 ජාලගතවීම්
36 පේටන්ට් බලපත්‍ර
37 සිසුන් සඳහා පහසුකම්
38 2022 දී ලද සම්මාන
38 CSR ක්‍රියාකාරකම්
40 තත්ත්ව සහතිකකරණය
41 2022 දෙසැම්බර් 31 දිනට සේවක වර්ගීකරණය
42 කාර්ය මණ්ඩල සංවර්ධනය, පුහුණුව හා සුබසාධනය 2022
43 විශේෂ ක්‍රියාකාරකම්
45 2023 වර්ෂය සඳහා වැඩ සැලැස්ම
47 තිරසාර සංවර්ධනය මත පදනම්ව පරිසරය සුරැකීමට සහ පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම උදෙසා සිදු කරන ක්‍රියාකාරකම් පිළිබඳ අනාගත ප්‍රක්ෂේපණ වාර්තාව
48 විගණකාධිපති වාර්තාව
56 විගණකාධිපති වාර්තාවට පිළිතුරු
59 2022 වසරේ අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳ සමාලෝචනය
60 වාර්ෂික මූල්‍ය වාර්තාව
85 විගණන වාර්තාවේ සාරාංශය සහ ප්‍රතිකර්ම ක්‍රියා

අධ්‍යක්ෂකතුමාගේ සමාලෝචනය



කොළඹ විශ්වවිද්‍යාලයීය පේවරසායන, අණුක පේවවේද හා පේවතාක්ෂණ ආයතනය ස්විඩන ජාත්‍යන්තර සංවර්ධන සහයෝගිතා නියෝජිතායතනය හරහා මූල්‍ය ආධාර ඇතිව 2003 වර්ෂයේදී සංස්ථාපිත කරන ලදී. IBMBB පිහිටුවීමේදී එහි පුරෝගාමී අධ්‍යක්ෂක මහාචාර්ය එරික් කරුණානායක මහතාට ශ්‍රී ලංකාවේ අණුක පේවවේද ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි පුහුණුව ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් පැහැදිලි දැක්මක් තිබූ අතර එතුමා IBMBB පිහිටුවීමේදී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය.

මේ වන විට IBMBB ආයතනය අණුක පේවවේද ක්ෂේත්‍රයේ ඉගැන්වීම්, පුහුණුකිරීම්, උපදේශන, සේවා, පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල නියැලී සිටින අතර විද්‍යාපති පාඨමාලා තුනක්, සහතික පත්‍ර සහ කෙටිකාලීන පුහුණු වැඩසටහන් සාර්ථකව පවත්වා ගෙන යයි. පර්යේෂණ සහ සංවර්ධනය සඳහා ආයතනයෙහි කැපවීම ජාතික හා ජාත්‍යන්තර පිළිගැනීමට ලක් වූ අතර, උසස් අධ්‍යාපන ආයතන, පර්යේෂණ ආයතන සහ කර්මාන්ත සමඟ සහයෝගිතාව තහවුරු කර ගැනීමට ද හැකි විය.

රටේ ආර්ථික හා දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් මුහුණ පෑමට සිදු වූ අභියෝග මධ්‍යයේ වුවද 2022 වසර තුළදී 2022-2026 සඳහා උපායමාර්ගික කළමනාකරණ සැලැස්මට අනුගත වෙමින් IBMBB මනාව මෙහෙයවීම සහ නියාමනය කිරීම කළමනාකරණ මණ්ඩලය සහ අධ්‍යයන මණ්ඩල තුන විසින් සිදු කරන ලදී. 2022 දී, IBMBB විද්‍යාපති පාඨමාලා සඳහා බැඳෙන විද්‍යාර්ථීන් සංඛ්‍යාවෙහි සැලකිය යුතු වැඩි වීමක් දැකිය හැකි විය. එමෙන්ම සහතික පත්‍ර සහ කෙටි-පුහුණු වැඩසටහන්වලද, සීමාවාසික පුහුණු සහ ප්‍රාරම්භක ව්‍යාපෘති ද සාර්ථකව කරගෙන යන ලදී. තවද, IBMBB විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ අනෙකුත් පීඨ සහ උසස් අධ්‍යාපන ආයතන විසින් පවත්වනු ලබන උපාධි පාඨමාලා සඳහා මූල්‍යමය නොවන කැපවීමක් ලෙස සිය සහය ලබා දුන්නේය.

විදේශීය ප්‍රසම්පාදන සීමා කිරීම, දේශීය මුදල්වල සැලකිය යුතු අවප්‍රමාණය වීම සහ විදේශ මුදල් ප්‍රේෂණ සීමා කිරීම හේතුවෙන් 2022 වර්ෂය සඳහා රසායනික ද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය සහ ප්‍රාග්ධන ආයෝජන සඳහා පුනරාවර්තන වියදම් කළමනාකරණය කිරීම අතිශය අභියෝගාත්මක කටයුත්තක් විය. IBMBB මෙම බාධාවන් නිසි පරිදි වටහාගෙන වසර සඳහා පොදු ප්‍රසම්පාදන කැඳවුමක් සිදු කිරීම සහ අපේක්ෂිත ඍණාත්මක බලපෑම් අවම කිරීම උදෙසා අභ්‍යන්තර සහ බාහිර ප්‍රේෂණ සඳහා පහසුකම් සපයන විශේෂ විදේශ මුදල් ගිණුමක් ආරම්භ කිරීම වැනි පිළියම් පියවර කිහිපයක් ආරම්භ කළේය. මෙම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල අතිශයින් ඵලදායී වූ අතර ආයතනයෙහි අපේක්ෂිත කාර්යයන් සිය ප්‍රධාන දින දර්ශනයට අනුව සිදු කරන ලදී. තොරතුරු තාක්ෂණ යටිතල ව්‍යුහය ශක්තිමත් කිරීම මෙම වසරේ ප්‍රමුඛතාවයක් විය. ආගණනීය ඖෂධ සොයාගැනීම් වෙනුවෙන් නම් කරන ලද සේවාදායකයක් ලබා ගැනීම සඳහා අපි සැලකිය යුතු ප්‍රාග්ධන ආයෝජනයක් කළෙමු.

2022 වර්ෂයේදී, IBMBB අවබෝධතා ගිවිසුම් දෙකක්, ද්‍රව්‍ය හුවමාරු ගිවිසුම් දෙකක් සහ නිෂ්පාදන තුනක් දොරට වැඩීම තුළින් ඉතා සාර්ථක ලෙස කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ සිය සම්බන්ධතාවය තහවුරු කර ගැනීමට සමත් විය.

තවද, IBMBB විසින් 2022 වසර සඳහා ක්වින් එලිසබෙත් පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ සිය වාර්ෂික ස්ථානගත කිරීම ද ලබා ගන්නා ලදී.

නොබෝදා, රජයට අයත් උසස් අධ්‍යාපන ආයතන කිහිපයක් තරඟකාරී ගාස්තු ව්‍යුහයන් යටතේ අණුක ජීව විද්‍යා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි වැඩසටහන් ආරම්භ කළ බව පෙනී ගොස් තිබේ. කෙසේ වෙතත්, හොඳින් සුදුසුකම් ලත් විද්වතුන්ගේ සහාය ඇතිව අති නවීන රසායනාගාර පහසුකම් සැපයීමෙන් IBMBB සිය ප්‍රමිතීන් සියලුම කාර්යයන්වලදී නාමික ලාභයක් යටතේ පවත්වා ගෙන යයි.

කෙසේ වෙතත්, මෙම කැපවීම්වල සෘජු ප්‍රතිලාභ ඇගයීම අතිශයින් දුෂ්කර වන්නේ ඒවායේ අපේක්ෂිත ප්‍රතිඵල ක්‍රියාවට නැංවීමට දිගු කාලයක් ගත වන බැවිනි. ප්‍රකාශනය, ඉදිරිපත් කිරීම්, උපදේශන සේවා සහ පර්යේෂණ සහ සංවර්ධන මගින් දැනුම සම්ප්‍රේෂණය කිරීම 2022 වර්ෂය තුළ සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කළේය. සම-සමාලෝචනය කරන ලද, සුවිගත සඟරාවල අත්පිටපත් 30කට ආසන්න ප්‍රමාණයක් සහ දේශීය හා ජාත්‍යන්තර සංසදවල සන්නිවේදන 27ක් ප්‍රකාශයට පත් කිරීමෙන් මෙය පැහැදිලි විය.
බාහිර හා අභ්‍යන්තර ණය වැරදි කළමනාකරණය හා සම්බන්ධ දුර්වල ආර්ථික ක්‍රියාකාරිත්වය හේතුවෙන් 2022 වසර අතිශයින්ම අභියෝගාත්මක විය. ඒ අනුව, බංකොලොත්භාවය ප්‍රකාශ කිරීමට ශ්‍රී ලංකාවට බලකෙරුණු අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ආධාර ඇතිව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වේදනාකාරී ක්‍රියාවලිය ආරම්භ කළේය. අවාසනාවන්ත ලෙස, අවසාන මට්ටමේ ගිවිසුමකට එළඹීමේදී IMF සමඟ සාකච්ඡා කිරීමෙන් පෙනී ගියේ එම ගිවිසුමම සිදු කළ ප්‍රධාන මුදල් ප්‍රතිසංස්කරණ තවමත් අවසන් කර නොමැති බවයි. එවැනි තත්ත්වයන්වල ප්‍රතිඵල ලෙස විදේශ මුදල්වල දැඩි හිඟයක්, රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම, ඉහළ උද්ධමනය සහ ගෙවුම් ශේෂයේ විශාල හිඟයක් ඇති විය. මෙම සියලු අංග වත්මන් මූල්‍ය වර්ෂය තුළ IBMBB හි ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපා ඇත.

IBMBB හට සිය ආදායම ශක්තිමත් කර ගැනීමේ සහ වියදම් අවම කිරීමේ පුළුල් අරමුණක් ඇතිව මූලිකාංග කිහිපයක් කෙරෙහි අවධානය යොමු කිරීමට බල කෙරුනි. කෙසේ වෙතත්, සමහර කෙටි පුහුණු වැඩසටහන් සඳහා සිසුන් බඳවා ගැනීම් සැලකිය යුතු ලෙස අඩු බැවින් පාඨමාලා ගාස්තු සංශෝධනය කිරීම වැනි සමහර පියවර ඵලදායී නොවීය. 2023 වර්ෂය තුළ අපගේ විද්‍යාපති වැඩසටහන් වලද එම ප්‍රවණතාවයම අපේක්ෂා කරමි. ප්‍රසම්පාදනය හා සම්බන්ධ අධික පිරිවැය තවත් අභියෝගයක් වූ අතර දැඩි විදේශ මුදල් ද්‍රවශීලතා අර්බුදය හේතුවෙන් සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සැලකිය යුතු ලෙස ප්‍රමාද විය.

තවද, 2023 වසර සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් දැඩි මූල්‍ය සීමා කිරීමක් අපේක්ෂා කරන අතර හොඳින් විවිධාංගීකරණය වූ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග දැඩි ලෙස නිර්දේශ කරමි.රට තුළ පවතින ආර්ථික අර්බුදය ගැන සැලකීමේදී 2023 වසර සඳහා වන පුරෝකථනය එතරම් යහපත් නොවනු ඇත. ඒ අනුව, IBMBB මූල්‍ය ස්වාධිපත්‍යය සාක්ෂාත් කර ගැනීම සඳහා සිය ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීමේ දැක්මක් ඇතිව කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන සැලසුම්වල පූර්ණ ලෙස නියැලී සිටී. IBMBB කොළඹ විශ්වවිද්‍යාලය සහ ඉන්දියාවේ මදුරාසියේ ඉන්දියානු තාක්ෂණ ආයතනය එක්ව පිරිනමනු ලබන අණුක ජීව විද්‍යාව සහ පෙව තාක්ෂණය පිළිබඳ බාහිර උපාධි වැඩසටහනක් පිරිනැමීමට සියලු මූලික කටයුතු දැනටමත් ගෙන ඇත.

තවද, කර්මාන්ත සහයෝගිතා ශක්තිමත් කිරීම, උපදේශන සේවා සහ ජාලකරණය පුළුල් කිරීම IBMBB අපේක්ෂා කරන විකල්ප උපාය මාර්ග වේ. තවද, 2023 වසර සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් දැඩි මූල්‍ය සීමා කිරීමක් අපේක්ෂා කරන අතර හොඳින් විවිධාංගීකරණය වූ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග දැඩි ලෙස නිර්දේශ කරමි. රට තුළ පවතින ආර්ථික අර්බුදය ගැන සැලකීමේදී 2023 වසර සඳහා වන පුරෝකථනය එතරම් යහපත් නොවනු ඇත. ඒ අනුව, IBMBB මූල්‍ය ස්වාධිපත්‍යය සාක්ෂාත් කර ගැනීම සඳහා සිය ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීමේ දැක්මක් ඇතිව කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන සැලසුම්වල පූර්ණ ලෙස නියැලී සිටී. IBMBB කොළඹ විශ්වවිද්‍යාලය සහ ඉන්දියාවේ මදුරාසියේ ඉන්දියානු තාක්ෂණ ආයතනය එක්ව පිරිනමනු ලබන අණුක ජීව විද්‍යාව සහ පෙව තාක්ෂණය පිළිබඳ බාහිර උපාධි වැඩසටහනක් පිරිනැමීමට සියලු මූලික කටයුතු දැනටමත් ගෙන ඇත.

තවද, කර්මාන්ත සහයෝගිතා ශක්තිමත් කිරීම, උපදේශන සේවා සහ ජාලකරණය පුළුල් කිරීම IBMBB අපේක්ෂා කරන විකල්ප උපාය මාර්ග වේ

ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන්, IBMBB සිය ජාතික යුතුකම ඉටු කරමින් මෙන්ම පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා සිය යුතුකම් ඉටු කරමින් මෙම දුෂ්කර කාලය තුළ ඵලදායී ලෙස දියුණු වනු ඇතැයි මම විශ්වාස කරමි.

මහාචාර්ය ප්‍රසන්න ගල්හේන
අධ්‍යක්ෂ / IBMBB

IBMBB ආයතනයේ අධ්‍යක්ෂවරු

වර්තමාන අධ්‍යක්ෂ

මහාචාර්ය ප්‍රසන්න ගල්හේන

ආරම්භක අධ්‍යක්ෂ

මහාචාර්ය එරික් එච්. කරුණාරත්න	2004 - 2007

පූර්ව අධ්‍යක්ෂවරුන්

මහා. කමනි එච්. තෙන්නකෝන්	2007 - 2012
මහා. කමනි එච්. තෙන්නකෝන්	2013 ජනවාරි - මාර්තු (වැඩබලන අධ්‍යක්ෂ)
මහා. එම් එච් රෙස්වි ෂෙරිෆ්	2013 අප්‍රේල් - 2014 සැප්තැම්බර් (වැඩබලන අධ්‍යක්ෂ)
මහා. ශිරෝමා එම්. හඳුන්නෙත්ති	2014 ඔක්තෝබර් - 2015 ජනවාරි (වැඩබලන අධ්‍යක්ෂ)
මහා. ශිරෝමා එම්. හඳුන්නෙත්ති	2015 පෙබරවාරි - 2018 පෙබරවාරි
මහා. ටාරා ඩී. සිල්වා	2018 පෙබරවාරි - 2018 අගෝස්තු (වැඩබලන අධ්‍යක්ෂ)
මහා. ශිරෝමා එම්. හඳුන්නෙත්ති	2018 අගෝස්තු -2021 අගෝස්තු
මහා. ශිරෝමා එම්. හඳුන්නෙත්ති	2021 සැප්තැම්බර් 1 - 14 (වැඩබලන අධ්‍යක්ෂ)



IBMBB පිළිබඳ හැඳින්වීම

විෂයයන් දෙකක් 21 වැනි සියවසෙහි ආධිපත්‍යය දරනු ඇත.එනම් තොරතුරු හා පරිගණක තාක්ෂණය සහ අණුක ජීව විද්‍යාවයි. අන් ජාතීන්ට සාපේක්ෂව විද්‍යාව හා දැනුම මත පදනම් වූ සංවර්ධනය උදෙසා ආයෝජනය කළ ජාතීන් සැලකියයුතු ප්‍රගතියක් ලබා ඇත. සිය අසල්වැසි රටවල් ඒ අංශයෙන් බොහෝ ඉදිරියෙන් සිටියද ශ්‍රී ලංකාව තවමත් පෙවතාක්ෂණවේදය හා සම ක්ෂේත්‍රයන්හි විශාල ප්‍රගතියක් ලැබීමට තවමත් සමත්ව නැත.
පෙවතාක්ෂණවේදය හා සම ක්ෂේත්‍රයන් මත පදනම් වූ කර්මාන්තයන්හි නිඟයට ප්‍රධාන හේතුව වන්නේ එම ක්ෂේත්‍රයෙහි පුහුණු ශ්‍රමිකයන්ගේ නිඟය සහ නව ආයෝජන සඳහා ජාතික ප්‍රතිපත්තියක් නොමැතිකමයි.

කොළඹ විශ්වවිද්‍යාලයෙහි ස්වාධීන ආයතනයක් ලෙස පෙවරසායන අණුක පෙවවේද හා පෙව තාක්ෂණ ආයතනය (IBMBB) ස්ථාපිත කරන ලද්දේ ආයතනය සහ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලබන පෙවරසායන, අණුක පෙවවේද හා පෙව තාක්ෂණය වැනි ක්ෂේත්‍රයන් තුළ උපදෙස්, පුහුණුව, පර්යේෂණ හා සංවර්ධනය සහ උපදේශනය සැපයීම අරමුණු කරගනිමිනි. මෙය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගෙන තිබේ. IBMBB ස්ථාපනය කරන ලද්දේ ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය/සංවර්ධනය වෙමින් පවතින රටවල් සමග පර්යේෂණ සහයෝගිතාව සඳහා වූ ස්වීඩන ඒජන්සියෙහි (Sida/SAREC) ආධාරයෙන් අණුක පෙවෙවිද්‍යාව පිළිබඳව මහාචාර්ය එරික් එච්. කරුණානායකගේ නායකත්වයෙන් යුතුව දියත් කරන ලද ඉතාම සාර්ථක පර්යේෂණ වැඩසටහනක කුඩාප්‍රාප්තිය වශයෙනි. IBMBB ගොඩනැගිල්ල ඉදි කිරීම හා උපකරණ ලබාදෙන ලද්දේ ආයෝජන දෙපාර්තමේන්තුව (Sida\INEC) විසිනි. මේ සඳහා ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය (SIDA) විසින් ශ්‍රී ලංකා රජයට ස්වීඩන ක්‍රෝනර් (SEK) මිලියන 15ක සහන ණයක් ප්‍රදානය කරන ලදී.

2004 අප්‍රේල් 28 වන දින IBMBB ආයතනය උත්සවාකාරයෙන් විවෘත කරන ලද්දේ කොළඹ ස්වීඩන තානාපති කාර්යාලයේ දූතමණ්ඩල ප්‍රධානී ගරු ඈන් මේරි ෆැලනියස් මැතිනිය සහ ස්වීඩනයේ උප්සලා විශ්වවිද්‍යාලයෙහි උප මණ්ඩපාධිපති මහාචාර්ය උල්ෆ් පීටර්සන් විසිනි. 2003 අප්‍රේල් 03 වන දින සහ අංක 1282/25 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් අදාළ ආඥා පණත නිකුත් කරන ලදී. IBMBB ගොඩනැගිල්ල කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රයේ පිහිටා ඇත. IBMBB ගොඩනැගිල්ල අණුක පෙවවේද ක්ෂේත්‍රයෙහි භාවිතවන නවීනතම උපකරණ වන පූර්ණ ස්වයංක්‍රීය ඩී. එන්. ඒ. අනුක්‍රමික, මයික්‍රෝ ඇරේස්කෑනර්, FPLC, HPLC ප්‍රතිදීප්ත සහ කලා අසමතා අන්වීක්ෂ (Fluorescence and Phase Contrast microscopes, laminar floor hoods)

සත්ත්ව හා ශාක පටක විද්‍යාගාරය තුළ වර්ධනය කිරීමේ පහසුකම්, පර්යේෂණ සත්වාගාර, ශීතාගාර, ස්ථානීය ජාලකරණය (LAN), විශේෂ ප්‍රකාශ තන්තු කේබල් මගින් අන්තර්ජාල ප්‍රවේශය ආදියෙන් සමන්විත වන අතර සම්පූර්ණයෙන් වායුසමීකරණය කර ඇත. IBMBB ආයතනය සිය පර්යේෂණ කටයුතු අරඹන ලද්දේ 2004 ජූනි මාසයේය. 2004 දී මහාචාර්ය එරික් කරුණානායකගේ සුපරීක්ෂණයෙන් දර්ශනපති හා දර්ශනසූරී උපාධි සඳහා හැදෑරුම් කරමින් සිටි සිසුන් සිය අධ්‍යයන කටයුතු IBMBB ආයතනයෙන් සිදුකළ අතර පර්යේෂණ උපාධි සඳහා නව සිසුන් බඳවා ගැනීම් ද 2004 දී සිදුවිය. 2005 පෙබරවාරි මස "අණුක පේවවිද්‍යාව" "සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය" පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලා දෙකක් ආරම්භ විය. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගනක පාසල සමග ඒකාබද්ධ වැඩ සටහනක් ලෙස පේව තොරතුරුවේදය පිළිබඳ තෙවන විද්‍යාපති උපාධි වැඩසටහන 2012 මැයි මස ආරම්භ විය.

2019 වර්ෂය අග භාගය වන විට මෙම SLQF 8-10 මට්ටම්වලට අනුගාමී වන පරිදි මෙම උපාධි වැඩසටහන්වල විෂයමාලා සංශෝධනය කරන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාවෙන් අනුමත වූ සංශෝධිත අතුරු ව්‍යවස්ථා හා රෙගුලාසි සහිතව සංශෝධිත විෂයමාලා ඉගැන්වීම 2019 දී ආරම්භ විය.


එක් එක් වැඩසටහන සඳහා ලියාපදිංචි වූ සිසුන් අතරින් අවශ්‍ය සුදුසුකම් ලබාගත් සිසුන්ට අදාළ ක්ෂේත්‍රය පිළිබඳ විද්‍යාපති උපාධිය පිරිනැමේ. ඔවුන්ගේ පළමු අධ්‍යයන වර්ෂය තුළ අවශ්‍ය සුදුසුකම් සපුරාලීමට නොහැකි වූ සිසුන්ට අණුක ජීව විද්‍යා විද්‍යාපති උපාධිය, සෛලීය හා අණුක ප්‍රතිශක්ති විද්‍යා විද්‍යාපති උපාධිය සහ පේව තොරතුරු විද්‍යාපති උපාධි ලබා ගත හැකිය. වාර්ෂිකව, උසස් තත්ත්වයේ පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා ගැනීමේ අරමුණින් මෙම පශ්චාත් උපාධි වැඩසටහන් තුන සඳහා කැපී පෙනෙන සිසුනු සංඛ්‍යාවක් ලියාපදිංචි වෙති.

එක් එක් වැඩසටහන සඳහා ලියාපදිංචි වූ සිසුන් අතරින් අවශ්‍ය සුදුසුකම් ලබාගත් සිසුන්ට අදාළ ක්ෂේත්‍රය පිළිබඳ විද්‍යාපති උපාධිය පිරිනැමේ. සිය පළමු අධ්‍යයන වර්ෂය තුළ අවශ්‍ය සුදුසුකම් සපුරාලීමට නොහැකි වූ සිසුන්ට අණුක ජීව විද්‍යා විද්‍යාපති උපාධියක්, සෛලීය හා අණුක ප්‍රතිශක්තිවේද විද්‍යාපති උපාධියක් සහ පේව තොරතුරු විද්‍යාපති උපාධි ලබා ගත හැකිය. ශාස්ත්‍රපති උපාධිය දක්වා ඉදිරියට යාමට අවශ්‍ය නොවන හෝ එසේ කිරීමට සුදුසුකම් නොසපුරන සිසුන්ට ලබා දී ඇති නිර්ණායක සපුරාලීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා අධ්‍යයන කටයුතු නැවැත්විය හැකිය. සෑම විද්‍යාපති ශිෂ්‍යයෙක්ම සිය දෙවන අධ්‍යයන වර්ෂය තුළ පර්යේෂණ ව්‍යාපෘතියක නිරත වන අතර එමඟින් අවසානයේ දී අදාළ ක්ෂේත්‍රවලට ප්‍රතිලාභ සැලසෙන නව්‍ය ප්‍රතිඵල ලැබේ.

ඊට අමතරව දේශීය හා විදේශීය අධ්‍යයන සහ කාර්මික සහයෝගිතාවයන් සමඟින් දර්ශනපති /දර්ශනසූරී වැඩසටහන් හරහා වාර්ෂිකව දර්ශනපති /දර්ශනසූරී අභ්‍යාසලාභීන් ගණනාවක් බිහි කරනු ලැබෙනි. මීට අමතරව, ආයතනය විසින් කෙටි කාලීන පුහුණු පාඨමාලා මාලාවක් පිරිනමනු ලබන අතර, එමඟින් පර්යේෂකයන්ව නිශ්චිත න්‍යායික හා ප්‍රායෝගික දැනුමෙන් සන්නද්ධ කරයි.

පිරිනමනු ලබන කෙටි කාලීන පාඨමාලාවලට අණුක ජීව විද්‍යාත්මක ශිල්පීය ක්‍රම, සෛල රෝපණ ශිල්පීය ක්‍රම, ප්‍රතිශක්තිකරණ ශිල්පීය ක්‍රම, ජාන ක්ලෝනීකරණය සහ ප්‍රතිසංයෝජක ප්‍රෝටීන ප්‍රකාශනය සහ වර්ණාදේහ ශිල්පීය ක්‍රම ඇතුළත් වේ. දින පහක කාලයක් පුරා පවත්වනු ලබන මෙම පාඨමාලා ආචාර්යවරුන්ගේ, පර්යේෂකයන්ගේ සහ පර්යේෂණ වෘත්තිකයන්ගේ කුසලතා වර්ධනය සඳහා පහසුකම් සපයයි. IBMBB හි ඇති සම්පත් බාහිර පර්යේෂකයන් සඳහා සේවා සැපයීම සඳහා භාවිතා කරනු ලැබේ, මෙයට අනුක්‍රමික සේවා, සෛල රෝපණය, පවිත්‍රණය, ප්‍රතිශක්තිකරණ විද්‍යාව යනාදිය ඇතුළත් වේ. IBMBB සීමාවාසික පුහුණුව සඳහා පහසුකම් සපයන අතර පර්යේෂණ සිසුන්ට සහ අපේක්ෂිත පර්යේෂකයන්ට පර්යේෂකයෙකු සමඟ දීර්ඝ කාලයක් සමීපව කටයුතු කිරීමට සහ නව ශිල්පීය ක්‍රම සහ පර්යේෂණ සැලසුම් කිරීම, සූදානම් කිරීම් ආදිය පිළිබඳ නවතම තොරතුරු ඉගෙන ගැනීමට අවස්ථාව ලබා දේ.

ආයතනික ව්‍යුහය


රේඛීය අමාත්‍යංශය
(උසස් අධ්‍යාපන අමාත්‍යංශය)
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
(UGC)
කොළඹ විශ්වවිද්‍යාලය
උපකුලපති
පෙට්රසායන, අණුක පෙට්වේදී හා පෙට තාක්ෂණවේදී ආයතනය
අධ්‍යක්ෂ සහ කළමනාකරණ මණ්ඩලය
විගණන
කමිටුව
පේ්‍ය.ස.ලේ/SAR
නි.මූ./DB
මූල්‍ය හා
කළ. කමිටුව
පර්.හා උසස්
උපාධි කමිටුව
අධ්‍යයන
කමිටුව
සහ.ලේ
තත්ව සහතිකකරණ
කුටිය
ව්‍යාපාර සංවර්ධන
ඒකකය
අධ්‍යයන මණ්ඩලය -
අණුක පෙට්වේදය
අධ්‍යයන මණ්ඩලය -
සෙලියස සහ අණුක
ප්‍රතිශක්තිවේදය
අධ්‍යයන මණ්ඩලය -
පෙට්වෙතොරතුරුවේදය

කළමනාකරණ මණ්ඩලයෙහි සාමාජිකයන්

මහා. ප්‍රසන්න ගල්හේන	අධ්‍යක්ෂ-IBMBB, (සභාපති)
ජේ.ඒ.සී. එච්. ජයසිංහ මිය	අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිත
සම්මානිත මහා. එරික් එච්. කරුණාරත්න	විවිප්‍රකො විසින් නම්කළ
සම්මානිත මහා. කමනි තෙන්නකෝන්	විවිප්‍රකො විසින් නම්කළ
සම්මානිත මහා. එස්.පී.දැරණියගල	විවිප්‍රකො විසින් නම්කළ
මහා. රමණි විජේසේකර	විවිප්‍රකො විසින් නම්කළ
චන්න ද සිල්වා මහතා	සනාතන සභාව නම් කල
අශාන් ජෝසප් වාස් මහතා	සනාතන සභාව නම් කල
මහා. සම්පත් පුංචිහේවා	සනාතන සභාව නම් කල
මහා. සේනත රාජපක්ෂ	සනාතන සභාව නම් කල
මහා. චපිර දිසානායක	පීඨාධිපති/ වෙද්‍ය පීඨය, කොළඹ වි.වි, නිල බලයෙන් පත්වූ
මහා.උපුල් සොන්නාදර	පීඨාධිපති/ විද්‍යා පීඨය, කොළඹ වි.වි, නිල බලයෙන් පත්වූ
ආචාර්ය අජන්ත අතුකෝරළ	අධ්‍යක්ෂ, පරිගණක පාසල (UCSC), නිල බලයෙන් පත්වූ
මහා. ෂර්මිලා ජයසේන	අංශ ප්‍රධානී / පෙව රසායනය සහ අණුක ජීව විද්‍යාව අ.අංශය, වෛද්‍ය පීඨය, නිල බලයෙන් පත්වූ

පශ්චාත් උපාධි පාඨමාලා

අධ්‍යයන මණ්ඩල - සෛලීය සහ අණුක ප්‍රතිශක්තිවේදය (CMI), අණුක පේවෙවේදය (MLS), පේවෙතොරතුරුවේදය (BI)

IBMBB හි ප්‍රධාන අධ්‍යයන ධාරා තුන අධ්‍යයන මණ්ඩල තුනකින් පාලනය වේ. සෛලීය සහ අණුක ප්‍රතිශක්තිවේදය, අණුක පේවෙවේදය සහ පේව තොරතුරුවේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩල විසින් එක් එක් විෂය ක්ෂේත්‍රය තුළ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, මාස්ටර්ස් වැඩසටහන් මෙන්ම විද්‍යාපති උපාධිවල අධ්‍යයන කටයුතු කළමනාකරණය කරයි. සෑම මණ්ඩලයක්ම එහි විෂය ක්ෂේත්‍රයේ විෂය පථයට අයත් කෙටි පාඨමාලා පිරිනැමීම ද පාලනය කරයි. අධ්‍යයන මණ්ඩලය විෂය අන්තර්ගත සංවර්ධන සහ අධ්‍යාපනයෙහි යෙදී සිටින අභ්‍යන්තර හා බාහිර විශේෂඥයන් ඇතුළු අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් සමන්විත වේ.

ඔවුහු පිළිවෙලින් මාස්ටර්ස් සහ විද්‍යාපති උපාධි සම්පූර්ණ කරන සිසුන්ගේ සියලුම පාඨමාලා වැඩ ක්‍රියාකාරකම් මෙන්ම මාර්ගෝපදේශිත ස්වාධීන අධ්‍යයන සහ පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීමට ලක් කරති.


මාස්ටර්ස් සහ විද්‍යාපති පාඨමාලා

2022 පෙබරවාරි මාසයේදී, අණුක පේවෙවේදය, සෛලීය සහ අණුක ප්‍රතිශක්තිවේදය පිළිබඳ උපාධි වැඩසටහන් සඳහා නව සිසුන් බඳවා ගැනීම සිදු විය. සංශෝධිත විෂයමාලාවට අනුව, ශාස්ත්‍රපති (SLQF 9) උපාධි සඳහා ලියාපදිංචි වූ සිසුන්ගේ 4 වන කණ්ඩායම වන මෙයට පිළිවෙලින් අණුක ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාපති (MLS) සිසුනු විසිපස් දෙනෙක් සහ සෛලීය සහ අණුක ප්‍රතිශක්තිවේදය පිළිබඳ විද්‍යාපති (CMI) සිසුන් විසි හතර දෙනෙක් ඇතුළත් වෙති.

2022 දී අණුක පේවෙවේදය පිළිබඳ විද්‍යාපති උපාධිය සඳහා සිසුන් පහලොස් දෙනෙකු, සෛලීය හා අණුක ප්‍රතිශක්තිවේදය විද්‍යාපති උපාධිය සඳහා සිසුන් දොලොස් දෙනෙකු සහ පේව තොරතුරුවේදය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා සිසුන් හත් දෙනෙකු ලියාපදිංචි වී සිය විද්‍යාපති පර්යේෂණ ව්‍යාපෘති කටයුතු කරගෙන ගොස් ඇත. අණුක පේවෙවේදය සිසුන් දොලොස් දෙනෙකු, සෛලීය සහ අණුක ප්‍රතිශක්තිවේදය පිළිබඳ විද්‍යාපති සිසුන් හය දෙනෙකු සහ පේව තොරතුරුවේදය පිළිබඳ විද්‍යාපති සිසුන් තිදෙනෙකු 2022 දී විභාගය සඳහා සිය නිබන්ධනය ඉදිරිපත් කළහ.




මාස්ටර්ස් උපාධි සඳහා නව ලියාපදිංචිවීම්




විද්‍යාපති උපාධි සඳහා නව ලියාපදිංචිවීම්


2022 දී, MLS සිසුන් හතර දෙනෙකු, CMI සිසුවෙකු සහ BI හි සිසුන් තිදෙනෙකු 2022 තුළ විද්‍යාපති අධ්‍යයන කටයුතු සාර්ථකව නිම කර ඇත. BI හි තවත් සිසුහු හය දෙනෙක් විද්‍යාපති උපාධි වැඩසටහනෙන් ඉවත් වීමට තීරණය කළහ. MLS හි තවත් සිසුන් දෙදෙනෙක් සහ BI හි එක් සිසුවෙක් පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ගනිමින් වැඩසටහනෙන් ඉවත් වීමට තීරණය කළහ.



MLS ප.උ.ඩිප්./ මාස්ටර්ස් හා විද්‍යාපති උපාධි ලබා ගැනීම්



CMI ප.උ.ඩිප්./ මාස්ටර්ස් හා විද්‍යාපති උපාධි ලබා ගැනීම්



BI ප.උ.ඩිප්./ මාස්ටර්ස් හා විද්‍යාපති උපාධි ලබා ගැනීම්


දර්ශනපති / දර්ශනසූරී උපාධි වැඩ සටහන්

එක් දර්ශනපති /දර්ශනසූරී සිසුවෙක් 2022 තුළ ලියාපදිංචි වූ අතර IBMBB හි ලියාපදිංචි දර්ශනපති /දර්ශනසූරී සිසුහු දහනව දෙනෙක් සිටියහ. දර්ශනපති /දර්ශනසූරී උපාධි මත පදනම් වූ පර්යේෂණ වැඩසටහන් පර්යේෂණ ක්‍රියාකාරකම් යටතේ විස්තර කෙරේ. දර්ශනසූරී සිසුන් පස් දෙනෙකු සහ දර්ශනපති සිසුවෙකු විභාග සහ වාචික පරීක්ෂණය සඳහා සිය නිබන්ධන ඉදිරිපත් කළ අතර දර්ශනසූරී සිසුහු පස් දෙනෙක් 2022 දී වාචික පරීක්ෂණය සම්පූර්ණ කළහ

2018	2019	2020	2021	2022
නව ලියාපදිංචිවීම්	නව ලියාපදිංචිවීම්	නව ලියාපදිංචිවීම්	නව ලියාපදිංචිවීම්	නව ලියාපදිංචිවීම්
05	02	03	-	01
සම්පූර්ණ කිරීම්	සම්පූර්ණ කිරීම්	සම්පූර්ණ කිරීම්	සම්පූර්ණ කිරීම්	සම්පූර්ණ කිරීම්
03	09	02	01	05

පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය - 2020

2020 සම්ප්‍රදායානුකූල පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය 2022 ඔක්තෝබර් 11 සහ 12 යන දිනවල පවත්වන ලදී. IBMBB හි උපාධිධාරීන් 22 දෙනෙකුට 2022 පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි ප්‍රදානය කරන ලදී.



කෙටි පාඨමාලා සහ පුහුණු වැඩ සටහන්

ප්‍රතිශක්තිවේදය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව

කොළඹ විශ්වවිද්‍යාලයේ පේව රසායනවේදය, අණුක පේවවේදය සහ පේව තාක්ෂණ ආයතනය (IBMBB) 2022 ඔක්තෝම්බර් 14 වැනි දින ප්‍රතිශක්තිවේදය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාවෙහි 3 වන කණ්ඩායම සාර්ථකව සම්පූර්ණ කළේය. මෙම වසරේ සිසුහු 19 දෙනෙක් විශිෂ්ට සාමාර්ථ පහක් සහ කුසලතා සාමාර්ථ හතක් ලබමින් වැඩසටහන සම්පූර්ණ කළහ.

මෙම සම්මාන ප්‍රදානෝත්සවය IBMBB හිදී පැවැත්වූ අතර උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූයේ කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච් ඩී කරුණාරත්න මහතාය. IBMBB හි අධ්‍යක්ෂ මහාචාර්ය ප්‍රසන්න ගල්හේන සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී කේ.ඒ.එස්. එඩිවඩ් යන මහත්වරු ද මීට සහභාගී වූහ. මෙම පාඨමාලාව IBMBB හි මිශ්‍ර ඉගෙනුම් ක්‍රමයට පවත්වන ලද පළමු අධ්‍යයන වැඩසටහන විය.

කොළඹ විශ්වවිද්‍යාලය විසින් සම්පූර්ණ කරන ලද යුනෙස්කෝ අරමුදල් සහිත මිශ්‍ර ඉගෙනුම් ව්‍යාපෘතිය හරහා එය ආරම්භ කරන ලදී. AdvCert(Immunolology) වැඩ සටහන ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි (SLQF) 2 මට්ටම හා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට සමපාත වේ.

ජාන ක්ලෝනීකරණය සහ ප්‍රතිසංයෝජිත ප්‍රෝටීන ප්‍රකාශනය පිළිබඳ පුහුණු වැඩ සටහන

කොළඹ විශ්වවිද්‍යාලයේ පේව රසායනවේදය, අණුක පේවවේදය සහ පේව තාක්ෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද "ජාන ක්ලෝනීකරණය සහ ප්‍රතිසංයෝජක ප්‍රෝටීන ප්‍රකාශනය" පිළිබඳ පුහුණු පාඨමාලාව 2022 නොවැම්බර් 14 සිට 18 දක්වා IBMBB පරිශ්‍රයේ දී සාර්ථකව පවත්වන ලදී

තරුණ විද්‍යාඥයින්, ආචාර්යවරුන්, උපාධි/පශ්චාත් උපාධි සිසුන් සහ ජීව විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය අපේක්ෂාවෙන් සිටින සිසුන් සඳහා මෙම පුහුණු පාඨමාලාව පවත්වන ලදී. නවීන පේව තාක්ෂණයේ PCR ප්‍රගුනය සහ ක්ලෝනකරණය, ප්‍රතිසංයෝජක ඉදිකිරීම් සකස් කිරීම, ඩීඑන්ඒ පරිවර්තනය, ප්‍රෝටීන් ප්‍රකාශනය සහ පවිත්‍රණය, ප්‍රෝටීන් ස්ඵටිකීකරණය, පේව තොරතුරු/පරිගණක ග්‍රැෆික් මත පදනම් වූ අභ්‍යාස ආදිය මගින් භාවිත කරන ප්‍රෝටීනවල ව්‍යුහාත්මක ප්‍රතිවේදයන් හඳුනා ගැනීම වැනි නවීනතම මෙන්ම බහුලව භාවිතා වන ක්‍රම පිළිබඳ

අත්දැකීම් ලබා ගැනීමට පුහුණු පාඨමාලාව මඟින් අවස්ථාව සලසා ඇත. ජාන ක්ලෝනකරණය සහ ප්‍රතිසංයෝජක ප්‍රෝටීන ප්‍රකාශනය යන ක්ෂේත්‍ර පිළිබඳව තම දැනුම පුළුල් කර ගැනීමට මෙම පුහුණු පාඨමාලාව සහභාගි වන්නන්ට කදිම අවස්ථාවක් විය. පුහුණු පාඨමාලාව විවෘත සාකච්ඡාවකින් අවසන් වූ අතර එහිදී සහභාගිවූවෝ පුහුණු පාඨමාලාව පිළිබඳ ඔවුන්ගේ අදහස් බෙදාගත්හ. එහි අන්තර්ගතය සහ සංවිධානය යන දෙකම බෙහෙවින් අගය කරන ලදී. ඉදිරියේදී මෙවැනි පාඨමාලා රැසක් පැවැත්වීමට ඔවුහු යෝජනා කළහ.



තරුණ විද්‍යාඥයින්, විද්වතුන්, උපාධි/පශ්චාද් උපාධි අපේක්ෂකයින් සහ ජීව විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය අපේක්ෂාවෙන් සිටින සිසුන් සඳහා මෙම පුහුණු පාඨමාලාව පවත්වන ලදී..



තරුණ විද්‍යාඥයින්, විද්වතුන්, උපාධි/පශ්චාද් උපාධි අපේක්ෂකයින් සහ ජීව විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය අපේක්ෂාවෙන් සිටින සිසුන් සඳහා මෙම පුහුණු පාඨමාලාව පවත්වන ලදී..

ප්‍රතිශක්තිකරණවේද ශිල්පක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාව

කොළඹ විශ්වවිද්‍යාලයේ පේෂව රසායනවේදය, අණුක පේෂවේදය සහ පේෂව තාක්ෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද "ප්‍රතිශක්තිකරණවේද ශිල්පක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාව " 2022 දෙසැම්බර් 12 සිට 16 දක්වා IBMBB පරිශ්‍රයේ දී සාර්ථකව පවත්වන ලදී.

සහභාගිත්වය වෛද්‍යවරුන්, ආචාර්යවරුන්, විද්‍යා උපාධිධාරීන්, විද්‍යා උපාධි අපේක්ෂකයින් සහ අ.පොෂ.ස. උසස් පෙළ සුදුසුකම් ලද්දන්ගෙන් සමන්විත විය. පුහුණු පාඨමාලාව ආවරණය කරන ලද ප්‍රායෝගික සංරචකයට සෙල වෙන්කරගැනීමේ ක්‍රම, ලියුකෝසයිට් බහිස් රෝපණය, සෛල ගණන ක්‍රම, ප්‍රතිශක්තිකරණ සෛල සඳහා ක්‍රියාකාරී පරීක්ෂණ සහ ප්‍රතිශක්තිකරණ පරීක්ෂණ (ELISA, IFA, Immunochromatography, SDS-PAGE, Western Blotting) ඇතුළත් වේ.
මෙම පුහුණු පාඨමාලාව සහභාගි වන්නන්ට ප්‍රතිශක්තිකරණ ශිල්පීය ක්ෂේත්‍රය පිළිබඳ තම දැනුම පුළුල් කර ගැනීමට මහඟු අවස්ථාවක් වූ අතර සහභාගිවූවෝ පාඨමාලාව බෙහෙවින් අගය කළහ.



පුහුණු පාඨමාලාව ආවරණය කරන ලද ප්‍රායෝගික සංරචකයට සෛල නූදකලා කිරීමේ ක්‍රම, ලියුකෝසයිට් වල සනාල වගා කිරීම, සෛල ගණන ක්‍රම, ප්‍රතිශක්තිකරණ සෛල සඳහා ක්‍රියාකාරී පරීක්ෂණ සහ ප්‍රතිශක්තිකරණ පරීක්ෂණ ඇතුළත් වේ.



සහභාව වෛද්‍ය නිලධාරීන්, විද්වතුන්, විද්‍යා උපාධිධාරීන්, විද්‍යා උපාධි අපේක්ෂකයින් සහ අ.පොෂ.ස. උසස් පෙළ සුදුසුකම් ඇති අයගෙන් සමන්විත විය..

අණුක පේෂවේද ශිල්පක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාව

කොළඹ විශ්වවිද්‍යාලයේ පේෂව රසායනවේදය, අණුක පේෂවේදය සහ පේෂව තාක්ෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද "අණුක පේෂවේද ශිල්පක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාව " 2022 අගෝස්තු 22 සිට 26 දක්වා IBMBB පරිශ්‍රයේ දී සාර්ථකව පවත්වන ලදී.
මෙම වැඩසටහනට ඉල්ලීම් සහ අයදුම්පත් විශාල ප්‍රමාණයක් ලැබුණු නමුත්, මෙම වැඩසටහන සඳහා පහසුකම් සැපයිය හැකි වූයේ විවිධ දැනුම් ක්ෂේත්‍ර නියෝජනය කරන පුද්ගලයන් තිස් එක් දෙනෙකු සඳහා පමණි

තරුණ විද්‍යාඥයින්, ආචාර්යවරුන්, උපාධි/පශ්චාත් උපාධි සිසුන් සහ පීව විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය අපේක්ෂාවෙන් සිටින සිසුන් සඳහා මෙම පුහුණු පාඨමාලාව පවත්වන ලදී. පුහුණු පාඨමාලාව DNA නිස්සාරණය සහ ප්‍රමාණකරණය, PCR, RT-PCR, ජෙල් විද්‍යුතාගමනය, සීමා කිරීම් බණ්ඩක දිග බහුරූපතාව, DNA අනුක්‍රම නිර්ණය සහ වෙනත් ආශ්‍රිත පේෂව තොරතුරු මෙවලම් භාවිතය පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට ඉඩ සලසා දුන්නේය.මීට අමතරව, ව්‍යාධිජනක රෝග නිර්ණය කිරීමේදී සහ විකෘති හඳුනාගැනීමේදී තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම පිළිබඳව සාකච්ඡා කර ඇත

අණුක පේෂවේද ශිල්පක්‍රම පිළිබඳව තම දැනුම පුළුල් කර ගැනීමට මෙම පුහුණු පාඨමාලාව සහභාගිවන්නන්ට කදිම අවස්ථාවක් විය. පුහුණු පාඨමාලාව විවෘත සාකච්ඡාවකින් අවසන් වූ අතර එහිදී සහභාගිවූවෝ පුහුණු පාඨමාලාව පිළිබඳ ඔවුන්ගේ අදහස් බෙදාගත්හ. එහි අන්තර්ගතය සහ සංවිධානය යන දෙකම බෙහෙවින් අගය කරන ලදී.

BMS ප්‍රායෝගික පරීක්ෂණ ආදර්ශනය

BMS ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණ ශිල්ප ප්‍රදර්ශනය


IBMBB විසින් BMS විද්‍යා පාසලෙහි පවත්වනු ලබන උසස් ඩිප්ලෝමා වැඩ සටහනෙහි සිසුන් සඳහා ශිෂ්‍ය සීමාවාසික වැඩසටහනක් වෙනුවෙන් පහසුකම් සපයන ලදී.

මෙම සීමාවාසික පුහුණුව 2022 ජුනි 06 සිට 10 දක්වා සහ 2022 ජුනි 20 සිට 24 දක්වා සිසුන් 39 දෙනෙකු සඳහා සංවිධානය කරන ලදී. මෙම සිසුන් IBMBB හි අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය විසින් පුහුණු කර අධීක්ෂණය කරන ලදී

සිසුන්ට න්‍යාය පිළිබඳ පැහැදිලි කිරීම් ලැබුණු අතර ඉන් පසුව ඔවුහු දත්ත ප්‍රායෝගික හා විශ්ලේෂණයන්හි නිරත වූහ. DNA නිස්සාරණය, PCR විස්තාරණය සහ එහි යෙදීම් මෙන්ම අනුක්‍රමික තාක්ෂණික ක්‍රම මෙයට ඇතුළත් විය.

සැසිවලට දේශන, ආදර්ශන, ලොග් පොත් ඇගයීම සහ ප්‍රශ්න සහ පිළිතුරු සැසි ඇතුළත් විය. වැඩසටහන අවසන් වූ පසු මෙම පාඨමාලාවේ සිසුන්ගේ නිපුණතාවය ස්ථානීය පරීක්ෂණයක් මගින් ඇගයීමට ලක් කරන ලදී.එයට IBMBB හි විද්‍යාත්මක කණ්ඩායම විසින් පහසුකම් සපයන ලදී. ඉන් අනතුරුව, උගත් ශිල්පීය ක්‍රමවල ප්‍රායෝගික යෙදීම් පිළිබඳ සිසුන්ගේ අවබෝධය පහසු කිරීම සඳහා ඉදිරිපත් කිරීම් සහිත ස්වාධීන පර්යේෂණ මාතෘකා සිසුන්ට පවරා ඇත.

ඒවා අවසන් වූ පසු, පර්යේෂණ ව්‍යාපෘතියක් ප්‍රායෝගිකව සිදු කරන්නේ කෙසේදැයි ඉගෙන ගැනීමට අධීක්ෂකවරුන් පස් දෙනෙකු සමඟ සමීපව වැඩ කළ සිසුන් 5 දෙනෙකුට කෙටි කාලීන පර්යේෂණ ව්‍යාපෘති පිරිනමන ලදී. මෙම වැඩසටහන ව්‍යාපාර සංවර්ධන ඒකකය විසින් කළමනාකරණය කරන ලද අතර වැඩසටහන අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලදී.



පර්යේෂණ ක්‍රියාකාරකම්

නිවර්තන - පරපෝෂිත හා බෝවන රෝග, අණුක වෛද්‍ය විද්‍යාව, පුරාණ DNA අධ්‍යයනය, ශාක අණුක ජීව විද්‍යාව, පරිවෘත්තීයවේදය, අණුක ප්‍රතිශක්ති විද්‍යාව සහ ප්‍රතිශක්තිකරණ රෝග විනිශ්චය, ඖෂධීය ශාක, සත්ව විශේෂ අණුක හඳුනාගැනීම, භාවනාව සහ සෞඛ්‍යය, කාර්මික වශයෙන් වැදගත් ක්ෂුද්‍ර ජීවීන්ගේ අණු හඳුනා ගැනීම යන ක්ෂේත්‍රවල පර්යේෂණ වැඩසටහන් ගණනාවක් IBMBB හි ක්‍රියාත්මක වෙමින් පවතී.

2022 වර්ෂය තුළ කාර්මික යෙදුම් සහිත පර්යේෂණ ව්‍යාපෘති කිහිපයක් ද පවත්වන ලදී. සෑම පර්යේෂණ වැඩසටහනකටම ආයතනයේ අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ සහ සහයෝගීතා විද්‍යාඥයින්ගේ අධීක්ෂණය යටතේ දර්ශනපති / දර්ශනසූරී සහ විද්‍යාපති සිසුන් සඳහා පර්යේෂණ පුහුණුව ලබා දෙන ව්‍යාපෘති කිහිපයක් ඇත. සිසුන්, පර්යේෂණ ව්‍යාපෘති සහ අධීක්ෂකවරුන් පහත වගුවේ ලැයිස්තුගත කර ඇත.

සම-සමාලෝචිත, සුචිගත කරන ලද, ජාත්‍යන්තර සඟරාවල පළ වූ මුලු පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව 30 කි. ජාත්‍යන්තර සාරාංශ ඇතුළු විද්‍යාත්මක රැස්වීම්වලදී පර්යේෂණ සන්නිවේදනයන් 27 ක් ඉදිරිපත් කරන ලදී

පර්යේෂණය	පර්යේෂකයින්	ප්‍රදාන
ආසාදක රෝග		
බරවා		
විභව්‍ය ඖෂධ ඉලක්ක හඳුනා ගැනීම සඳහා නව පරම්පරාවේ අනුක්‍රමික (NGS) තාක්ෂණයන් භාවිතා කරමින් *Setaria digitata* ජෙනෝමය පිළිබඳ අධ්‍යයනයන් 2022 දී ආචාර්ය උපාධි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පැවතිනි.	මහාචාර්ය එරික් බොංගකැම්-රුඩ්ලොෆ් (උප්සලා විශ්ව විද්‍යාලය, ස්වීඩනය), මහාචාර්ය එරික් කරුණානායක (IBMBB) හා මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන් (IBMBB) දර්ශනසූරී සිසුවා : කාංචන එස්. සේනානායක මහතා	ස්වීඩන සබැඳි ප්‍රදාන
ලෙප්ටොස්පයිරෝසිස් (මී උණ)		
අසාධ්‍ය හා විවිධත්වයන් සහිත ලෙප්ටොස්පයිරෝසිස් රෝගීන්ගෙන් ඉවත් කරගනු ලැබූ Leptospira ප්‍රවේණිදර්ශ සහ මස්තු දර්ශ හඳුනා ගැනීම මෙම ජාතික පර්යේෂණ සහා ප්‍රදානයෙහි අවසන් වාර්තාව 2022 ඔක්තෝබර් මස ඉදිරිපත් කරන ලදී.	මහා. ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB) ආචාර්ය ජගත්ප්‍රිය වීරසේන, මහා. සුනිල් ප්‍රේමවංස (UOC) හා මහා. සේනක රාජක්ෂ (UOC). ස්වේච්ඡා පර්යේෂණ සහකාර - යොමේන්ද්‍රා ද සිල්වා මිය	ජාතික පර්යේෂණ සභාව මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්තිට IBMBB (NRC -17-098)

ඩෙංගු		
ස්ථාවර උෂ්ණත්ව යටතේ ලූප භාවිතයෙන RNA ගුණනය කිරීමෙන් (RT -LAMP) සිදුවන වර්ණ විපර්යාස හරහා ඩෙංගු ආසාදිත මදුරුවන් (Aedes mosquitoes) තුල පවතින ඩෙංගු වෛරස කාණ්ඩ හඳුනා ගැනීම සඳහා අඩු පිරිවැය හා නවීන මදුරු වාහක සමීක්ෂණ මෙවලමක් ස්ථාපිත කිරීම. 2022 දී ආචාර්ය උපාධි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පැවතිනි.	PI: විශේෂඥ වෛද්‍ය හසිත තිසේරා, අධ්‍යක්ෂ - ජාතික ඩෙංගු පාලන ඒකකය (NDCU) ((දැනට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා ඒකකයේ),මහා. ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB), ආචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ වීරසේන (IBMBB), ආචාර්ය සිසිර පතිරණ (IBMBB),ආචාර්ය සුබාෂිනි ආර්යප්‍රේම (එක්සත් රාජධානියේ ලිවර්පූල් වී. වී.), ආචාර්ය රුෂිකා පෙරේරා (ඇ. ඒ. ජ. කොලරාඩෝ ප්‍රාන්ත වී. වී.) දර්ශනපති /දර්ශනසූරී සිසුවා : සකුන්තලා ජානකි මිය (කීට විද්‍යාඥ, NDCU)	ජාතික පර්යේෂණ සභාව ආචාර්ය එච්. තිසේරාට (NRC-19- 065)
ඩෙංගු වයිරසය ආසාදනය වූ අවුරුදු 5-15 අතර ළමුන්ගේ රුධිර ප්‍රතිඔක්සිකාරක ධාරිතා මට්ටම් කෙරෙහි විටමින් E අතිරේකයේ බලපෑම පර්යේෂණ අධ්‍යයන සැලසුම් 2022 දී ආරම්භ කරන ලදී.	මහා. ශිරෝමා හඳුන්නෙත්ති, මහාචාර්ය පූජිත වික්‍රමසිංහ, මහාචාර්ය සිසිර පතිරණ, ආචාර්ය දුලානි සමරනායක, කෞෂල්‍ය අනුරාධ මයා, ආචාර්ය ඩිලානි රුක්ෂලා විද්‍යාපති සිසුවා : ස්ටෙෆනි දුරෙයිසාමි මිය	CMI වැඩ සටහන් අයවැය
ඩෙංගු වෛරසය ආසාදනය වූ අවුරුදු 5-14 අතර ළමුන්ගේ රුධිර ප්‍රතික්‍රියාශීලී නයිට්‍රජන් අතරමැදි මට්ටම්වලට විටමින් E අතිරේකයේ බලපෑම පර්යේෂණ අධ්‍යයන සැලසුම් 2022 දී ආරම්භ කරන ලදී.	මහාචාර්ය සිසිර පතිරණ, මහාචාර්ය පූජිත වික්‍රමසිංහ, මහා. ශිරෝමා හඳුන්නෙත්ති, ආචාර්ය ඩිලානි රුක්ෂලා ආචාර්ය දුලානි සමරනායක, කෞෂල්‍ය අනුරාධ මයා විද්‍යාපති සිසුවා : මීනු රොඩ්‍රිගෝ මිය	CMI වැඩ සටහන් අයවැය
ඩෙංගු වයිරසය ආසාදනය වූ අන්තරාසර්ග සෛල කෙරෙහි සත්දරණි (SD) හි සනාල ප්‍රතිශක්ති උත්තේජක බලපෑම පර්යේෂණ අධ්‍යයන සැලසුම් 2022 දී ආරම්භ කරන ලදී.	ආචාර්ය භාග්‍යා දීපචන්ද්‍රි, මහාචාර්ය සිසිර පතිරණ, සඳුනි ද කොස්තා මිය,මහා. ශිරෝමා හඳුන්නෙත්ති විද්‍යාපති සිසුවා : චින්තනී ද සිල්වා මිය	විද්‍යාපති-CMI වැඩ සටහන් අයවැය
මැලේරියාව		
ශ්‍රී ලංකාවේ මැලේරියාව නැවත ප්‍රතිස්ථාපනය වැළැක්වීමේ අදියර පිළිබඳ අධ්‍යයනයන්: පරපෝෂිතවේදී සහ අණුක රෝග විනිශ්චය ක්‍රම සැසඳීම සහ ආසාදන වල අණුක ලක්ෂණ විභාගය 2022 දී ආචාර්ය උපාධි ව්‍යාපෘතිය නිමවිය.	මහාචාර්ය දීපිකා ප්‍රනාන්දු (UOC), මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (UOC), මහා. ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ආචාර්ය ඕ. වී. ඩී. එස්. ජේ. වීරසේන (IBMBB), ආචාර්ය රසින්තා ප්‍රේමරත්න (මැලේරියා විරෝධී ව්‍යාපාරය- AMC) දර්ශනසූරී සිසුවා : ඩබ්. එම්. කුමුදු ටී ද අල්විස්-ඩබ් ගුණසේකර මිය	ජාතික විද්‍යා පදනම මහාචාර්ය දීපිකා ප්‍රනාන්දුට (NSF/RG/2014/HS/03)
වටපණු ආසාදනය		
කිරිපණු ආසාදන ඇති රෝගීන්ගේ රුධිරයේ, අනෙකුත් පටකවල සහ අසූචි වල ප්‍රති-කිරිපණු ප්‍රතිදේහ සහ කිරිපණු ප්‍රතිදේහ ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය පර්යේෂණ අධ්‍යයන සැලසුම් 2022 දී ආරම්භ කරන ලදී.	ආචාර්ය සිසිර පතිරණ, මහාචාර්ය ෂර්මිණි ගුණාවර්ධන, සඳුනි ද කොස්තා මිය විද්‍යාපති සිසුවා : චතුර රණතුංග මහතා	විද්‍යාපති-CMI වැඩ සටහන් අයවැය

ක්ෂය රෝගය		
ප්‍රති මයිකොබැක්ටීරියා කාරක ලෙස අයන පොම්ප, අයන නාලිකා අනුකූලක හා විටමින් ඩී පිළිබඳ නාලස්ථ ඇගයුම 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි	ආචාර්ය සිසිර පතිරණ (IBMBB), ආචාර්ය නිලන්ති සේනානායක (UoC), මහා. ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB) විද්‍යාපති සිසුවා : වෛද්‍ය තිළිණි අබේකෝන්	විද්‍යාපති-CMI වැඩ සටහන් අයවැය
Mycobacterium tuberculosis මගින් උත්තේජනය කරන ලද THP-1 ව්‍යුත්පන්න මානව මහාභක්ෂාණු මත අයන පරිවහන අනුකූලක සහ විටමින් D වල ප්‍රතිශක්තිකරණ අනුකූලතාවය විද්‍යාපති ව්‍යාපෘතිය නිම කරන ලද අතර 2022 දී නිබන්ධනය ඉදිරිපත් කරන ලදී.	ආචාර්ය සිසිර පතිරණ (IBMBB), ආචාර්ය නිලන්ති සේනානායක (UoC), මහා. ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB) විද්‍යාපති සිසුවා : අමිලා නන්දසේන මිය	විද්‍යාපති-CMI වැඩ සටහන් අයවැය
SARS-CoV-2		
අභ්‍යන්තරික IgG සහ IgM ELISA භාවිතයෙන් තක්සේරු කරන ලද ප්‍රතිදේහ ප්‍රතිචාරය සමග රෝග උග්‍රත්වය සහ වෛරසයේ ප්‍රවේණික සම්බන්ධතාව හදුනාගැනීම 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය පී. පී. එස්. එල්. පතිරණ (IBMBB), මහාචාර්ය ඉනෝකා පෙරේරා (UOC), මහා. ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB), ජේමිස් තම්බිරාජා මහතා (IBMBB), දක්ෂිකා ගංගානි මිය (IBMBB), මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (UOC), මහාචාර්ය සේනක රාජපක්ෂ (UOC), තේජානී පෙරේරා මිය (UOC), සහන් සිරිවර්ධන මහතා (UOC), ආචාර්ය රජීව ද සිල්වා (MRI), ආචාර්ය ධනුෂ්ක දසනායක (MRI), ආචාර්ය සුරංග මානිල්ගම (MoH), ආචාර්ය රෝහිත මුතුගල (MoH), ආචාර්ය ධනංජා නාමලි (MoH), ආචාර්ය ගයානි ප්‍රේමවංස (MoH), ආචාර්ය සාරංග සුමතිපාල (MoH), මහාචාර්ය ඇන්ඩ්‍රියාස් නීෂේ (රොබට් කොක් ආයතනය, ජර්මනිය) පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක: ආචාර්ය පේශල ගුණසේකර (IBMBB) (2021 ඔක්තෝබර් දක්වා), ආචාර්ය භාග්‍යා දීපචන්දි(IBMBB)	ජර්මනියේ රොබට් කොක් ආයතනය විසින් මූල්‍ය අනුග්‍රහය දක්වන IDEA ව්‍යාපෘතිය
SARS-CoV-2 හි ස්පයික් ප්‍රෝටීන් 1 සමඟ අන්තර්ක්‍රියා කරන මානව නියුට්‍රොෆිල මත සත් දරනී (SD) හි නාල ප්‍රතිශක්ති මූර්ජන බලපෑම පර්යේෂණ කටයුතු 2022 දී ආරම්භ කරන ලදී.	මහා. සිසිර පතිරණ, මහා. ශිරෝමා හඳුන්නෙත්ති, කෞශල්‍ය අනුරාධ මහතා, ආචාර්ය භාග්‍යා දීපචන්දි විද්‍යාපති සිසුවා : ගෞරි කෞෂල්‍යා මිය	විද්‍යාපති-CMI වැඩ සටහන් අයවැය

වෛරස එන්සෙෆලයිටිස්		
ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යාත්මක වශයෙන් වැදගත් වවුලන්ගේ ව්‍යාධිජනක රෝගකාරක සහ වෛරස් එන්සෙෆලයිටිස් රෝගී අවස්ථා පිළිබඳ ප්‍රතිශක්තිකාරක හා අණුක හඳුනා ගැනීම දර්ශනපති/ දර්ශනසූරී වැඩ සටහන 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්ය විපුල යාපා, සම්මානිත මහාචාර්ය සුනිල් ප්‍රේමවංස, මහාචාර්ය ඇන්ඩ්‍රියාස් නීෂේ, ආචාර්ය ක්ලෝඩියා කෝල්, මහාචාර්ය ඉනෝකා පෙරේරා, ආචාර්ය ගයානි ප්‍රේමවන්ස, මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන, මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති දර්ශනපති/ දර්ශනසූරී සිසුවා: තේජානි පෙරේරා මිය	ජර්මනියේ රොබට් කොක් ආයතනය විසින් මූල්‍ය අනුග්‍රහය දක්වන IDEA ව්‍යාපෘතිය
අණුක වෛද්‍ය විද්‍යාව		
පිළිකා සහ පිළිකා කඳ සෛල		
ශ්‍රී ලංකාවේ මහා බඩවැලේ පිළිකා ඇති රෝගීන් සමූහයක් තුළ මහා බඩවැලේ පිළිකා ආශ්‍රිත පිටපත් 2 RNA ජාන සහ පිළිකා අවදානම් අපේක්ෂක 8 RNA ජානවල කායික විකෘති හඳුනා ගැනීම 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය සුමාධි ද සිල්වා (IBMBB), ආචාර්ය සුදේශිනි හේවගේ (IBMBB), වෛද්‍ය කනිෂ්ක ද සිල්වා (ජාතික පිළිකා ආයතනය, මහරගම) විද්‍යාපති සිසුවා : රුසිරු පබසර කෙහෙල්ගමුව මහතා	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
ශ්‍රී ලංකාවේ පියයුරු පිළිකා ඇති රෝගීන් සමූහයක HOX පිටපත් කිරීමේ ප්‍රතිදේහජනක RNA ජානයේ තෝරාගත් SNP හඳුනාගැනීම 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය සුමාධි ද සිල්වා (IBMBB), ආචාර්ය සුදේශිනි හේවගේ (IBMBB), වෛද්‍ය කනිෂ්ක ද සිල්වා (ජාතික පිළිකා ආයතනය, මහරගම) විද්‍යාපති සිසුවා: ෆාතිමත් ආනන් ෂෆී මිය	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
විරල පියයුරු පිළිකා ආශ්‍රිතව ඩී ලූපයෙහි ඇති වන මයිටොකෝන්ඩ්‍රියානු DNA විකෘතතාවල සහ මයිටොකෝන්-ඩ්‍රියානු DNA ඒකකාණ්ඩවල ස්වභාවය හඳුනා ගැනීම දර්ශනසූරී වැඩ සටහන 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහා. කමනි එච්. තෙන්නකෝන්(ප්‍රධාන අධීක්ෂක), ආචාර්ය රුවන්දි රණසිංහ (සම අධීක්ෂක), වෛද්‍ය කනිෂ්ක ද සිල්වා (සම අධීක්ෂක, ජාතික පිළිකා ආයතනය) දර්ශනසූරී සිසුවා : ජේ.ටී. කොතලාවල මෙය	කොතලාවල මහත්මිය ලබාගත් ආචාර්ය උපාධි ශිෂ්‍යත්වය (NSF/SCH/ 2016/004)
ශ්‍රී ලංකාවේ සිංහල ජනවාර්ගික රෝගීන්ගේ විරල පියයුරු පිළිකා සඳහා අවදානම් සාධක වශයෙන් මයිටොකෝන්ඩ්‍රියල් ප්‍රවේණි අණුවල විකෘතකා සහ බහුරූපිතා දර්ශනපති/ දර්ශනසූරී වැඩ සටහන 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහා. කමනි එච්. තෙන්නකෝන්(ප්‍රධාන අධීක්ෂක), ආචාර්ය රුවන්දි රණසිංහ (සම අධීක්ෂක), වෛද්‍ය කනිෂ්ක ද සිල්වා (සම අධීක්ෂක, ජාතික පිළිකා ආයතනය) දර්ශනපති/දර්ශනසූරී සිසුවා: එල්. ජයසේකර මිය	NRC ප්‍රදානය මහාචාර්ය කමනි තෙන්නකෝන්ට (NRC- 17-020)
මධ්‍යසාර නොවන ස්ටීටෝහෙපටයිටිස් (Steatohepatitis (NASH) ආශ්‍රිත සිරෝසිස් වල යාකෘත් සෙලේය පිළිකා (HCC) සඳහා පුරෝකථන සලකුණු සඳහා ජාන විශ්ලේෂණය දර්ශනපති/ දර්ශනසූරී වැඩ සටහන 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය සුදේශිනී හේවගේ (ප්‍රධාන අධීක්ෂක), මහාචාර්ය රොහාන් සිරිවර්ධන (සම අධීක්ෂක කැළණිය විශ්වවිද්‍යාලය), මහා. කමනි තෙන්නකෝන් (සම අධීක්ෂක IBMBB), මහාචාර්ය මදුනිල් නිරිඇල්ල (සම අධීක්ෂක- කැළණිය වි.වි.), ආචාර්ය සුමාධි ද සිල්වා (සම අධීක්ෂක IBMBB) දර්ශනපති/ දර්ශනසූරී සිසුවා : සෞම්‍යා සමරසිංහ	NRC ප්‍රදානය ආචාර්ය සුදේශිනී හේවගේට (NRC -19 -030)

ශ්‍රී ලංකාවේ ආවේණික ශාකවලින් පියයුරු පිළිකා සඳහා පිළිකා පියවි සෛල ඉලක්ක කරගත් ඖෂධ සෙවීම 2022 දී දර්ශනසූරි උපාධියක් සම්පූර්ණ කරන ලදී.	ආචාර්ය සමීර සමරකෝන් (PI-IBMBB). මහා. කමනි එච්. තෙන්නකෝන්(IBMBB), මහාචාර්ය නීලිකා මලවිගේ (USJP), වෛද්‍ය කනිෂ්ක ද සිල්වා (ජාතික පිළිකා ආයතනය, මහරගම) මහාචාර්ය දිලිප් ඊ. ද සිල්වා (UOC) දර්ශනපති /දර්ශනසූරි සිසුවා : උමා රාජගෝපාලන් මිය	ජාතික පර්යේෂණ සභා ප්‍රදානය (NRC 14-067) ආචාර්ය සමීර සමරකෝන්ට
POLG1 ජානයේ exon 3 හි ජන්මානුපථ ප්‍රභේද: පොලිමරේස් දාම ප්‍රතික්‍රියාව ප්‍රශස්ත කිරීම සහ තෝරාගත් සිංහල පුද්ගලයන් කිහිප දෙනෙකු තුළ මූලික විශ්ලේෂණය 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය රුවන්දි රණසිංහ (ප්‍රධාන අධීක්ෂක), ජොආන් කොතලාවල මෙය (සම-අධීක්ෂක), මහාචාර්ය කමනි එච් තෙන්නකෝන් (සම-අධීක්ෂක) විද්‍යාපති සිසුවා : චමල්කා මනෝහාරි කාරියවසම්	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
පීසීආර් ප්‍රශස්තිකරණය සහ සිංහල වාර්ගිකත්වය සහිත විරල පියයුරු පිළිකා රෝගීන් සඳහා තෝරාගත් පොලිමරේස් ගැමා එක්සෝන් ප්‍රයිමර් විස්තාරණය කිරීම 2022 දී අවසන් කරන ලදී.	ආචාර්ය රුවන්දි රණසිංහ (ප්‍රධාන අධීක්ෂක); උසස් ජාතික ඩිප්. සිසුවා : ජෝෂුවා මිගෙල් ආනන්දප්පා ව්‍යාපාර කළමනාකරණ පාසල (BMS), විද්‍යා පාසල	අරමුදල්: ව්‍යාපාර කළමනාකරණ පාසල (BMS)
පියයුරු පිළිකා රෝගීන්ගේ මයිටොකොන්ඩ්‍රියා හි ජාන පිටපත් කිරීමේ සාධක A (TFAM) සඳහා පොලිමරේස් දාම ප්‍රතික්‍රියා ප්‍රසස්ථ කිරීම 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය රුවන්දි රණසිංහ (ප්‍රධාන අධීක්ෂක), ජොආන් කොතලාවල මෙය (සම-අධීක්ෂක) විද්‍යාවේදී සිසුවා: එෆ්. ෆාෂා මෙනවිය, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය	අරමුදල්: ආචාර්ය රුවන්දි රණසිංහගේ පර්යේෂණ අරමුදල්
Modulation of Adiponectin expression during murine fibroblast (3T3L1) differentiation into adipocyte in-vitro 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්ය බී.පී.ගල්හේන ආචාර්ය සමීර ආර් සමරකෝන් ආචාර්ය සුපුන් විජයසිංහ විද්‍යාපති සිසුවා : පියුමි දිසානායක	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
ඊ සෛල ලිම්පෝමා ලෙස ප්‍රතිශක්තිකරණ රසායන විද්‍යාව මගින් කලින් තහවුරු කළ වසා ගැටිති පෙවේක්ෂා වල BCL2 විකෘතිතා 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්ය බී.පී.ගල්හේන වෛද්‍ය කනිෂ්ක සේනාතිලක නිර්මානී කළුආරච්චි මිය විද්‍යාපති සිසුවා : සමුද්‍ර කරුණාතිලක	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
පිළිකා ප්‍රාථමික සෛලවල ග්ලූකෝස් වල පරිවෘත්තිය හා සම්බන්ධ තෝරාගත් ජානවල ප්‍රකාශනයට ග්‍රැෆීන් ඔක්සයිඩ් බලපෑම 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය සමීර ආර් සමරකෝන් ආචාර්ය මෙරාන් එදිරිවීර මංජු ගුණවර්ධන මහතා විද්‍යාපති සිසුවා : නවෝද්‍යා සිල්වා	IBMBB (විද්‍යාපති අධ්‍යයන)

මානව DNA විචල්‍යතා සහ පැරණි DNA අධ්‍යයන		
ශ්‍රී ලංකාවේ අතීතයේ විසූ මානවයන් පිළිබඳ අණුක පුරාවිද්‍යාත්මක අධ්‍යයනය: උඩුපියන්ගල්ගේ සහ අළුගල්ගේ ලෙන් තුළින් ලබාගත් අස්ථි කොටස් ආශ්‍රයෙන් කරනු ලබන මයිටෝකොන්ඩ්‍රියල් අණුක ප්‍රවේණි ද්‍රව්‍ය සහ අණුක ලිංග නිර්ණ අධ්‍යනය. දර්ශනපති වැඩ සටහන 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය රුවන්දි රණසිංහ (ප්‍රධාන අධීක්ෂක), මහා. කමනි එච්. තෙන්නකෝන් සම අධීක්ෂක), මහාචාර්ය රාජ් සෝමදේව (සම අධීක්ෂක, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැළණිය වි.වි.), ආචාර්ය නිරාජ් රායි (සම අධීක්ෂක, BSIP, ලක්නව්, ඉන්දියාව) දර්ශනපති/දර්ශනසූරී සිසුවා : ඒ. එස්. ප්‍රනාන්දු මිය	NRC ප්‍රදානය ආචාර්ය රුවන්දි රණසිංහට (NRC- 17-042)
ශ්‍රී ලංකාවේ සිංහල, ශ්‍රී ලාංකික දෙමළ හා වැදි ජනගහණයන්හි පූර්ණ මයිටොකොන්ඩ්‍රියල් ජෙනෝමය පිළිබඳ සවිස්තර විශ්ලේෂණය දර්ශනපති වැඩ සටහන 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය රුවන්දි රණසිංහ (ප්‍රධාන අධීක්ෂක), මහා. කමනි එච්. තෙන්නකෝන්(සම අධීක්ෂක) දර්ශනපති/දර්ශනසූරී සිසුවා : අංජනා හර්ෂණී ජයසිංහ වැලිකල මිය	පර්යේෂණයේ මුල් කොටස අධීක්ෂක-වරුන්ගේ පර්යේෂණ අරමුදල්වලින් කරගෙන යමින් පවතී. තවදුරටත් අරමුදල් යොදවනු ඇත
නියැන්ඩර්තාල් ප්‍රවේණික Covid-19 ජානමය වෙනස්කම්: පොලිමරේස් දාම ප්‍රතික්‍රියා තත්ත්වයන් සහ සංඛ්‍යාත විශ්ලේෂණය තක්සේරු කිරීම 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය රුවන්දි රණසිංහ (ප්‍රධාන අධීක්ෂක), මහා. කමනි එච්. තෙන්නකෝන්(සම අධීක්ෂක), අමාලි ප්‍රනාන්දු මිය (සම අධීක්ෂක) විද්‍යාපති සිසුවා : සම්මානි හිමාෂා ගලගමආරච්චි	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
ජාන විකෘතිතා පිළිබඳ අණුකවිද්‍යාත්මක අධ්‍යයන		
බහිෂ්කේතනික තයිරොයිඩ් ග්‍රන්ථිය සහිත ශ්‍රී ලාංකික රෝගීන් සමූහයක NKX2-5 විකෘති විශ්ලේෂණය 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය සුදේශිනි හේවගේ, ආචාර්ය සුමාධි ද සිල්වා, ආචාර්ය නවෝදා අතපත්තු විද්‍යාපති සිසුවා : නිර්මානි ෆොන්සේකා	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
ස්ථිර සංජානනීය මන්ද තයිරොයිඩ්වාදය සහිත ශ්‍රී ලාංකික රෝගීන් සමූහයක DUOX2 විකෘතිය පිළිබඳ විශ්ලේෂණය 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය සුමාධි ද සිල්වා, ආචාර්ය සුදේශිනි හේවගේ, ආචාර්ය නවෝදා අතපත්තු විද්‍යාපති සිසුවා : පිරසන්තිනි තයාපරන්	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
ශ්‍රී ලංකාවේ 46 XY DSD දරුවන් මුළනුවක මිනිස් ලිංග නිර්ණය කිරීමේ ජානවල ලෝපන/අනුපිටපත් හඳුනාගැනීම 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය සුමාධි ද සිල්වා ආචාර්ය සුදේශිනි හේවගේ ආචාර්ය නවෝදා අතපත්තු විද්‍යාපති සිසුවා : ඩැනියෙල් සංජීව් ෆර්ඩිනැන්ඩිස්	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
NAFLD ව්‍යාධිජනකයට සම්බන්ධ රක්තපාත යකඩ සාන්ද්‍රණය තුළ අන්තර්ගත වූ ජාන බහුරූපතා 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය සුදේශිනි හේවගේ, ආචාර්ය සුමාධි ද සිල්වා මහාචාර්ය කමනි එච් තෙන්නකෝන් විද්‍යාපති සිසුවා : කාවින්දි සඳමාලි සායක්කාර	IBMBB (විද්‍යාපති අධ්‍යයන)

ශාක අණුක පෙප්වවේදය		
රතු තේ ආබද්ධයන්හි ඇන්තොසයනින් (nthocyanin) පැතිකඩ	ආචාර්ය එම්. ඒ. බී. රණතුංග (තේ පර්. ආයතනය), ඩී. කෝට්ටව ආරච්චි (තේ පර්. ආයතනය), මහාචාර්ය නිමල් පුණ්‍යසිරි	තේ පර්. ආයතනය
පෙප්ව සංස්ලේෂක එන්සයිම සහ ෆ්ලේවනොයිඩ් වල පෙප්ව සංස්ලේෂණය ප්‍රකාශ කිරීම කෙරෙහි තේ වගාවෙහි (Camellia sinensis) බුබුලු අංගමාර ආසාදනයෙහි (Exobasidium vexans infection) බලපෑම	විමර්ශකයන්: මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන, මහාචාර්ය නිමල් පුණ්‍යසිරි, ආචාර්ය එල්.එන්.ආර්. ගුණරත්න විද්‍යාපති සිසුවා : කේ. ඒ. එම්. ජේ. එදිරිසිංහ මිය	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
තේ දළු වල බුබුළු අංගමාරය රෝගයේ විනිවිද පෙනෙන අවධියේදී ෆ්ලේවනෙ-ායිඩ් නිෂ්පාදනය සහ ෆ්ලේවනොයිඩ් පෙප්ව සංස්ලේෂණ එන්සයිම ප්‍රකාශනය මත Exobasidium vexañ ආසාදනයේ බලපෑම 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්ය නිමල් පුණ්‍යසිරි මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන ආචාර්ය නිලූපා ගුණරත්න විද්‍යාපති සිසුවා : විඩාරා අනුෂොරෝ	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
ිබිම් කෙසෙලී දේශීය කෙසෙල් ප්‍රභේදෙ-ය් ව්‍යාප් කඳේ උසට වගකිව යුතු ජාන හඳුනා ගැනීම 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය නදීෂා ලෙව්කේ බණ්ඩාර මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන විද්‍යාපති සිසුවා : සවා අබු සහීඩ්	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
Lipañ ගණයේ අණුක වර්ගීකරණය (Orchidacé) 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය නදීෂා ලෙව්කේ බණ්ඩාර මහාචාර්ය ඇලෙසියෝ පැපිනි (Uni Firenze, ඉතාලිය) මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන විද්‍යාපති සිසුවා : උපමිතා සප්තකී ගුණවර්ධන	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
ශ්‍රී ලංකාවේ Tragia spp.(වල් කහඹිලියා) හි තීරු කේතකරණය 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන ආචාර්ය ටී එම් එස් පී තෙන්නකෝන් ආචාර්ය එල් එන් ආර් ගුණරත්න විද්‍යාපති සිසුවා : චර්ෂිනී ජේ පෙරේරා	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
t354 සහ Bg352 සහල් වර්ගවල තෝරාගත් ලවණ ප්‍රතිචාරක ජානවල ඇලලික් සහ ප්‍රකාශන වෙනස්කම් පිළිබඳ අධ්‍යයනයක්. විද්‍යාපති ව්‍යාපෘතිය 2022 දී අවසන් කරන ලද අතර දැනට විභාග වෙමින් පවතී.	මහාචාර්ය එන්.එස්. කෝට්ටේආරච්චි, මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන සහ ආචාර්ය එන්. ගුණරත්න විද්‍යාපති සිසුවා : ඩී.පී.රුවිනි ප්‍රභා පීරිස්	IBMBB (විද්‍යාපති අධ්‍යයන)

පරිවෘත්තීයවේදය		
සහල් වල ඇමයිනෝ අම්ල විශ්ලේෂණය මෙම ව්‍යාපෘතිය 2022 දී සාර්ථකව අවසන් කරන ලදී.	විමර්ශී ලියනාරච්චි (ITI), මහාචාර්ය කේ.ආර්. මහානාම (කොළඹ විශ්වවිද්‍යාලය), ආචාර්ය එච්.පී.පී.එස්. සෝමසිරි (ITI), මහාචාර්ය නිමල් පුණ්‍යසිරි (IBMBB)	කාර්මික තාක්ෂණ ආයතනය
ඖෂධ පරිවෘත්තීය	ආචාර්ය තුසිත වික්‍රමසිංහ සහ ඔහුගේ කණ්ඩායම, සායනික ඵෙවරසායන අ.අංශය, වෛද්‍ය පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය සහ මහා. නිමල් පුණ්‍යසිරි IBMBB	කැළණිය විශ්ව විද්‍යාලය
ජීව විද්‍යාත්මකව ක්‍රියාකාරී නව ද්විතියික පරිවෘත්තිකයන්ගේ පැවැත්ම පිළිබඳව හුඹසෙහි ව්‍යුත්පන්න දිලීර විමර්ශනය කිරීම	මහාචාර්ය නිමල් පුණ්‍යසිරි වෛද්‍ය නදීෂා ලෙව්කේ බණ්ඩාර මහාචාර්ය දිලිප් ද සිල්වා විද්‍යාපති සිසුවා : සිමිතියා සිවඥානසුන්දරම් රෙක්සන්	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
අණුක ප්‍රතිශක්තිවේදය, ප්‍රතිශක්ති සංජානන විධි විද්‍යාව සහ ස්වයං ප්‍රතිශක්තිකරණ රෝග		
ප්‍රතිශක්ති ඌනතා ජාන විද්‍යාව		
ලංකාවේ X-linked agammaglobulin-emi හි ජානමය රෝග විනිශ්චය: නියමු අධ්‍යයනයක් එක් විද්‍යාපති නිබන්ධනයක් 2022 දී භාර දෙන ලදී.	ආචාර්ය රජීව ද සිල්වා (MRI), ආචාර්ය ධනුෂ්ක දසනායක(MRI), ආචාර්ය කණිෂ්ක සෙනරත්, ජේම්ස් තම්බිරාජා මහතා විද්‍යාපති සිසුවා : නේරංජා සඳමිණී මිය	විද්‍යාපති-CMI වැඩ සටහන් අයවැය
ප්‍රතිශක්ති සංජානන විධි විද්‍යාව		
ශ්‍රී ලංකාවේ තෝරාගන්නා ලද වඩාත් ප්‍රචලිත මස්තුදර්ශ /මස්තුදර්ශ කාණ්ඩවල ලෙප්ටොස්පයිරා ප්‍රතිදේහ රෝග විනිශ්චය සඳහා නුමුහුන් ක්ලෝනික ප්‍රතිදේහ නිෂ්පාදනය	PI: මහා. ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), මහාචාර්ය සේනක රාජපක්ෂ (කොළඹ විශ්වවිද්‍යාලය), මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (කොළඹ විශ්වවිද්‍යාලය), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (ෂඊඑඊ-ඊ). සහකාරක: ආචාර්ය ලිලානි කරුණානායක (වෛද්‍ය පර්යේෂණ ආයතනය). දර්ශනපති/දර්ශනසූරී සිසුවා: දක්ෂිකා ගංගානි මිය	ජාන ඉංජිනේරු විද්‍යාව සහ ජෛව තාක්ෂණවේදය සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICGE-B), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්තිට IBMBB (ICGEB-CRP
නාල දාහක පරීක්ෂණ සඳහා ආදර්ශය-ක් ලෙස HL-60 promyeloblast සෛල පෙලෙන් වෙනස් වූ මහා භක්ෂාණු වල ප්‍රයෝජනය තක්සේරු කිරීම	ආචාර්ය නර්මදා ප්‍රනාන්දු, මහා. සිසිර පතිරණ, දක්ෂිකා ගංගානි මිය විද්‍යාපති සිසුවා : ඉෂාරා ගයාත්‍රී මිය	විද්‍යාපති-CMI වැඩ සටහන් අයවැය
විවිධ බැක්ටීරියා වලින් නිස්සාරණය කරන ලද ලිපොසැකරයිඩ(E coli" Leptospira" Burkholderi) මගින් ප්‍රේරණය කරන ලද සනාල ප්‍රදාහක මට්ටම සංසන්දනය කිරීම විද්‍යාපති පර්යේෂණ කටයුතු 2022 දී ආරම්භ කරන ලදී.	ආචාර්ය නර්මදා ප්‍රනාන්දු , මහා. සුනිල් ප්‍රේමවංස මහා. ඉනෝකා කොරයා, අනුරාධ කෞශල්‍ය මහතා විද්‍යාපති සිසුවා : ඉඳුවරි ගුණවර්ධන මිය	විද්‍යාපති-CMI වැඩ සටහන් අයවැය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශය 2022 ඔක්තෝම්බර් 27 වැනි දින කොළඹ විශ්වවිද්‍යාලයේ IBMBB හි සංචාරයක නිරත විය. මෙම ක්ෂේත්‍ර චාරිකාව ”ආහාර විද්‍යාවේ පෙව තාක්ෂණය” යන මාතෘකාව යටතේ පවත්වන ලද මොඩියුලයක් මත පදනම්ව 3 වන වසරේ සිට සිසුන් 42 දෙනෙකු සඳහා සංවිධානය කරන ලදී. IBMBB හි පවතින විවිධ වර්ගයේ විද්‍යාගාර, පර්යේෂණ සහ උපකරණ පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ දර්ශනසූරී සිසුන් විසින් ඔවුන්ව දැනුවත් කරන ලදී.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා IBMBB හි ප්‍රායෝගික ආදර්ශන

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ ජාන විද්‍යා හා අණුක ජීව විද්‍යා අංශයේ සිසුන් 2022 මාර්තු 22 සිට 25 දක්වා කොළඹ විශ්වවිද්‍යාලයේ IBMBB වෙත පැමිණ ඇත. සිසුන් 26 දෙනෙකු සඳහා ප්‍රායෝගික ආදර්ශන සංවිධානය කරන ලද අතර RNA - RNA නිස්සාරණය, cDNA සංස්ලේෂණය, තත්‍ය කාලීන qPCR ප්‍රෝටීන සඳහා ක්‍රම - ප්‍රෝටීන් අවක්ෂේපණය, සම්පූර්ණ ප්‍රෝටීන් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීම, SDS-PAGE, Western Blotting යන ක්‍රමවලට ශිල්පීය ක්‍රම ඒවා නිදර්ශන මාලාවක් හරහා ඉදිරිපත් විය.

ඊට අමතරව IBMBB හි ඇති විද්‍යාගාර, පර්යේෂණ සහ උපකරණ පිළිබඳව අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ දර්ශනසූරී සිසුන් විසින් හඳුන්වා දෙන ලදී. අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය බෙදාහැරීම සඳහා සම්බන්ධ වී සිටි ව්‍යාපාර සංවර්ධන ඒකකය විසින් සැසිය සැලසුම් කර කළමනාකරණය කරන ලදී.

IBMBB හි IQAC විසින් සම්බන්ධීකරණය කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශය - 2022

2022 වර්ෂයේදී ආචාර්ය නර්මදා ප්‍රනාන්දු IBMBB හි තත්ව සහතිකකරණ මධ්‍යස්ථානයෙහි (IQAC) සම්බන්ධීකාරක ලෙස කටයුතු කළ අතර ආචාර්ය ඩිලානි රුක්ෂලා IBMBB හි IQAC හි විද්‍යාත්මක සහකාරවරිය ලෙස සිය සේවය දිගටම කරගෙන ගියාය. ආයතනික සමාලෝචනය සඳහා සූදානම් කිරීම් වර්ෂය තුළ සිදු කරන ලද අතර ඒ සඳහා සම්බන්ධීකාරකවරුන් නැවත පත් කරන ලද අතර ඉදිරි ආයතනික සමාලෝචනය (IR) සැලකිල්ලට ගනිමින් එක් එක් නිර්ණායක යටතේ සෑම ප්‍රමිතියකටම වගකිව යුතු කාර්ය මණ්ඩලය හඳුනා ගන්නා ලදී.

ඒ සඳහා සූදානම් වීමේ වැඩ සැලැස්ම සාකච්ඡා කිරීම සඳහා සම්බන්ධීකාරකවරුන් සහ අනෙකුත් අදාළ කාර්ය මණ්ඩලය සඳහා රැස්වීම් තුනක් සංවිධානය කරන ලදී. සම්බන්ධීකාරකවරුන් විසින් හඳුනාගත් සාක්ෂි සමාලෝචනය කිරීම සඳහා තවත් රැස්වීම් හතක් පවත්වන ලද අතර ජේෂ්ඨ සහකාර ලෙකබාධිකරී ගේ එකඟතාවය ඇතිව එක් එක් නිර්ණායක සඳහා කළමනාකරණ සහායකයින් අනුයුක්ත කිරීමෙන් සාක්ෂි එකතු කිරීමේ ක්‍රියාවලිය පහසු කරන ලදී.

එපමනක් නොව, MS TEAMS වේදිකාවේ සාක්ෂි ඊ-අනුවාද එකතු කිරීමේදී යාන්ත්‍රණයක් සකස් කරන ලද අතර අදාළ සම්පත් ලබා ගත හැකි විය. ආයතනික සමාලෝචන සහ අදාළ තත්ව සහතිකකරණ රාමු පිළිබඳව අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් සැප්තැම්බර් මාසයේදී පවත්වන ලදී. IBMBB හි ආයතනික කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය පිහිටුවීම සඳහා මූලික කටයුතු සිදු කරන ලදී.

වැඩසටහන් සමාලෝචනය සඳහා සූදානම් වීම

SLQF මට්ටම් 11 සහ 12 වසර තුළද අඛණ්ඩව සිදු කරන ලද අතර ඉදිරි පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචනය සැලකිල්ලට ගනිමින් එක් එක් නිර්ණායක සඳහා සම්බන්ධීකාරකවරුන් පත් කරන ලද අතර SLQF මට්ටම් 11 සහ 12 සඳහා වැඩසටහන් සංවර්ධන කමිටුව පිහිටුවීම සඳහා මුල පිරීම් ගෙන QA අංශ සඳහා දායක විය.

ඒ සඳහා අදාළ ප්‍රතිපත්තිවලට අනුකූල වන අතරම නියාමන QA රාමු සහ ඒ සඳහා සම්මත කරන ලදී. ඒ වෙනුවෙන් SLQF මට්ටමේ 9 සහ 10 ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් වල SLQF අනුකූලතාව සහ මාස්ටර්ස් වැඩ සටහන් හයේම SLQF අනුකූලතාව පිළිබඳ ස්වයං ඇගයුම පෙන්නුම් කරන්නේ කෙසේද යන්න පිළිබඳව වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ සැසියක් 2022 මාර්තු මාසයේදී පවත්වන ලදී. ඉහත උපාධි පාඨමාලා වල සුදුසුකම් විස්තර කරන්නන් SLQF අනුකූලතාව පිළිබඳ ස්වයං ඇගයීමක් සිදු වෙමින් පවතී.

ශිෂ්‍ය ප්‍රතිචාර සහ පරාවර්තන සඳහා 2021 වසර සඳහා ගුරු කාර්ය සාධනය පිළිබඳ ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වාර්තා, 2021 වසර සඳහා පශ්චාත් උපාධි වැඩසටහන් සකස් කර අදාළ බලධාරීන්ට ඉදිරිපත් කරන ලදී. 2022 වසර සඳහා ඉගෙනුම් පරිසරය, ගුරු කාර්ය සාධනය, පශ්චාත් උපාධි වැඩසටහන සඳහා ශිෂ්‍ය ප්‍රතිචාර රැස් කරන ලදී. වාර්තා සකස් කෙරෙමින් පවතී.

2022 දෙසැම්බර් 31 වන දිනට ආයතනයෙහි සේවක වර්ගීකරණය

සේවක ප්‍රවර්ගය	වැටුප් කේතය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව		පුරප්පාඩු
			ස්ථිර	තාවකාලික	
ප්‍රාථමික මට්ටම - නුපුහුණු	U- PL 1	01	00	01	01
ප්‍රාථමික මට්ටම - අර්ධ	U- PL 2	03	03		
ප්‍රාථමික මට්ටම - පුහුණු	U- PL 3	01	01		
ද්විතියික මට්ටම					
කළමනාකාර සහකාර- තාක්ෂණික නොවන	U- MN 1	11	10	02*	01
කළමනාකාර සහකාර- තාක්ෂණික			03		
ආශ්‍රිත නිලධාරී- 2 ඛණ්ඩය	U- MT 1	04			
ආශ්‍රිත නිලධාරී- 1 ඛණ්ඩය			00		
මාණ්ඩලික සහකාර/ අධිශ්‍රේණි හා ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර	U- MN 2				
කළමනාකාර සහකාර තාක්ෂණික නොවන			00		
කළමනාකාර සහකාර- තාක්ෂණික	U- MN 3				
ආශ්‍රිත නිලධාරී- 2 ඛණ්ඩය			01**		
ආශ්‍රිත නිලධාරී- 1 ඛණ්ඩය	U- MN 4				
තෘතියික මට්ටම					
කනිෂ්ඨ විධායක / කළමනාකාර	U- EX 1	01	01		
අධ්‍යයන සහායක - 2 ඛණ්ඩය	U- AS 1	07*	01	08***	01
අධ්‍යයන සහායක - 1 ඛණ්ඩය	U- AS 2		03**		
ජ්‍යෙෂ්ඨ මට්ටම					
වෛද්‍ය නිලධාරී	U- MO 1	00	00		
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	U- MO 2	00	00		
මධ්‍යම මට්ටමේ විධායකයින්	U- EX 2	01	01		
මධ්‍යම මට්ටමේ විධායකයින්	U- EX 2 (a)	01	01	00	00
ජ්‍යෙෂ්ඨ විධායකයින්	U- EX 3	00	00		
කථිකාචාර්ය	U- AC 3	11	03	00	03
සහාය මහාචාර්ය	U- AC 4		00	00	
මහාචාර්ය / ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	U- AC 5		05	00	
අධ්‍යක්ෂ	U-AC 5	01	01	00	00
පශ්චාත් ආචාර්ය උපාධි අපේක්ෂක **	ස්ථාවර	03	00	02	01
තාවකාලික සහකාර කථිකාචාර්ය	ස්ථාවර	02	00	01	01

කාර්ය මණ්ඩල සංවර්ධනය, පුහුණුව සහ සුබසාධනය -2022

IBMBB එහි සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සහතික කිරීම සහ පහසුකම් සැලසිය යුතු යයි දැඩි ලෙස විශ්වාස කරයි. පහත සඳහන් කාර්ය මණ්ඩල සාමාජිකයින් තම කුසලතා තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා පුහුණුවීම්වල නියැලී සිටින අතර එමඟින් IBMBB විසින් විශිෂ්ටත්වය ලබා දීම සඳහා දායක වීමට ඔවුන්ට හැකි වේ. කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ සහභාගී වූ පුහුණු වැඩසටහන් පහත දැක්වේ.

නම	තනතුර	වැඩමුළුව / පුහුණු පාඨමාලාව	කාලසීමාව / දින
ඒ. ඒ ජයසෝම	මාණ්ඩලික තාක්ෂණික නිලධාරී	ප්‍රතිශක්තිකරණවේදය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව	මාස 4
මහාචාර්ය පී.ඒ නිමල් පුණ්‍යසිරි	මහාචාර්ය	අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ආබාධිත දැනුවත්භාවය සහ සංවේදීතාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - ආබාධිකත්ව පර්යේෂණ, අධ්‍යාපන සහ ප්‍රායෝගික මධ්‍යස්ථානය (CEDREP), කො.වි.වි.	මාස 03
බී.සී.එම්. පෙරේරා	කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය)	සාමාන්‍ය ලිපි ගොනුකරණය	2022 පෙබ. 23/24
වයි.බී.එම්.එන් වයි. බණ්ඩාර	රසායනාගාර සහායක (පහළ ශ්‍රේණිය)	ඩීසල් ජනක යන්ත්‍රවල ආරක්ෂිත මෙහෙයුම් සහ නඩත්තුව	2022 මැයි 27

IBMBB හි අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන

පුහුණු සංවර්ධනය මානව සම්පත් සංවර්ධනයෙහි ප්‍රධාන අංගයකි.
අනධ්‍යයන කාර්ය මණ්ඩල/ IBMBB සඳහා වන පළමු අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය මත පදනම්ව සංවිධානය කරන ලදී. ඒ අනුව පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ දින 6 ක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

1. IBMBB හි පරිපාලන රාමුව සහ ව්‍යවස්ථාපිත කමිටු හැඳින්වීම
2. සාමාන්‍ය පරිපාලනය
3. මූල්‍ය නියාමනය, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි සහ සාමාන්‍ය මූල්‍ය රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය හැඳින්වීම
4. අලුත්වැඩියා, සේවා ගිවිසුම්, සමීක්ෂණ මණ්ඩලය, පාඩු, කපා හැරීම
5. සාමාන්‍ය විගණන ක්‍රියා පටිපාටිය
6. විශ්වවිද්‍යාල සේවකයින්ගේ විනය කරුණු, අයිතිවාසිකම් සහ බැඳීම්

කොළඹ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී කේ.ඒ.එස්. එඩිවඩ් මයා, මූල්‍යාධිකාරී කේ.එස්.ටී.එස්. ජයසූරිය මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (සාමාන්‍ය පරිපාලන) එල්.පී. ද සිල්වා මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (අනධ්‍යයන ආයතන) දිලිනි පෙරේරා මහත්මිය, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (සැපයුම්) එච්.එම්. කේ. හේරත් මයා, නියෝජ්‍ය අභ්‍යන්තර විගණක එන්.පී. ද සිල්වා මිය සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (නීති සහ ප්‍රලේඛන) රංගිකා ලසන්ති මිය මෙම වැඩසටහනේ සම්පත් දායකයෝ වූහ.

සහභාගිවන්නන් විසින් සකස් කරන ලද කේවල පැතිකඩ තක්සේරු කරන ලදී.
විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා සහ IBMBB අධ්‍යක්ෂවරයා ඉදිරියේ සහතික ප්‍රදානය කරන ලදී.

සෞඛ්‍ය රක්ෂණය

IBMBB හි සේවකයින් සඳහා 2022 දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිපත්තියක් මිලදී ගන්නා ලදී. ආයතනයේ කළමනාකාරීත්ව මණ්ඩලය විසින් ආයතනය විසින් දරනු ලබන මුළු රක්ෂණ මුදලින් 50% ක් සුබසාධන පදනමක් මත මිලදී ගැනීමට අනුමත කරන ලදී. . IBMBB හි සේවකයින් 13 දෙනෙකු සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් 24 දෙනෙකු සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිපත්තියට ඇතුළත් කර ඇත. 2022 දී රු. 133,127.55 ක මුලු මුදලක් ආයතනයේ උත්පන්න අරමුදල්වලින් මේ සඳහා දරන ලදී.

තෙවන ජාත්‍යන්තර වාර්ෂික පර්යේෂණ සැසි සම්මේලනය - IBMBB

කොළඹ විශ්වවිද්‍යාලයීය පේව රසායනවේද, අණුක පේවවේදය සහ පේව තාක්ෂණවේද ආයතනය (IBMBB) වාර්ෂිකව පර්යේෂණ සැසි සම්මේලන පවත්වන අතර සෑම වසර 5කට වරක් ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණයක් පවත්වයි.

2022 දී, අණුක ජීව විද්‍යාවේ මායිම් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICF-MLS 2022) IBMBB හි සම්මන්ත්‍රණ ශාලාවේදී, "පශ්චාත් ගෙනෝම යුගයේ තිරසාර සංවර්ධනය සඳහා බහුවිධ පර්යේෂණ" යන තේමාව යටතේ පැවැත්විණි. කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් මෙම සමුළුව 2022 අප්‍රේල් 6 සිට 7 දක්වා පවත්වන ලද්දේ දෙමුහුන් ආකාරයෙනි.
ප්‍රතිකාර සඳහා ස්වභාවික නිෂ්පාදන, ප්‍රතිශක්තිකරණ හා ප්‍රතිශක්තිකරණ රෝග විනිශ්චය, ප්‍රතිකාර සඳහා ස්වභාවික නිෂ්පාදන, අණුක ප්‍රවේණි විද්‍යාව සහ ප්‍රවේණික වෛද්‍ය විද්‍යාව, ප්‍රතිකාර සඳහා ස්වභාවික නිෂ්පාදන, ජනගහන ජාන විද්‍යාව සහ පේව තොරතුරු යන ප්‍රධාන ක්ෂේත්‍ර පහක් ආවරණය වන පරිදි වාචික ඉදිරිපත් කිරීම් විසි හතක් සහ පෝස්ටර් ඉදිරිපත් කිරීම් විසි එකක් සිදු කරන ලදී.

නිරවද්‍ය පිළිකා විද්‍යාව, COVID-19 යාවත්කාලීන කිරීම්, ඖෂධ පරීක්ෂා කිරීමේ සහ සංවර්ධනයේ ප්‍රවණතා, මිනිසුන් සහ භාෂා පරිණාමය, ප්‍රතිශක්තිකරණ බූස්ටර ලෙස ස්වභාවික නිෂ්පාදන, ශාක ප්‍රවේණික සම්පත් සහ පේව තාක්ෂණය, ප්‍රතිශක්තිකරණ රෝග විනිශ්චය සහ ප්‍රතිශක්තිකරණ චිකිත්සාවේ ප්‍රවණතා සහ අවශ්‍යතා ලෙස සම්මන්ත්‍රණ සැසි සමුළුවට සම්මන්ත්‍රණ හතක් ද ඇතුළත් විය.

IBMBB වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ප්‍රධාන සිදුවීම ස්ටැන්ලි විජේසුන්දර අනුස්මරණ දේශනයයි. මෙවර එය "ශ්‍රී ලාංකීය ජනගහනයේ ජාන විද්‍යාව සහ ප්‍රවේනි විද්‍යාව - දශක හතරක සේවා සහ පර්යේෂණ පිළිබඳ අවබෝධය" යන මාතෘකාව යටතේ කොළඹ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨයේ පීඨාධිපති මූලාසන මහාචාර්ය ව්‍යුහවේදය, ප්‍රවේණි විද්‍යාව සහ පේව වෛද්‍ය තොරතුරු විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය විද්‍යා ජෝති මහාචාර්ය වපිර එච්. ඩබ්ලිව්. දිසානායක විසින් පවත්වන ලදී.

"පුරාවිද්‍යාව ප්‍රවේණි විද්‍යාව හමුවෙයි: ජනගහන ප්‍රාග් ඉතිහාසයේ නව මංපෙත්" යන මාතෘකාව යටතේ ප්‍රධාන දේශනය පවත්වනු ලැබුවේ කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුරාවිද්‍යා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව විසිනි.

"නිරවද්‍ය කෘෂිකර්මයේ සිට පුද්ගලීකරණය කරන ලද වෛද්‍ය විද්‍යාව දක්වා: ජීව විද්‍යාවේ අනාගත සහ වර්තමාන පර්යේෂණ පිළිබඳ සම්පූර්ණ දැක්මක්" යන මාතෘකාව යටතේ පූර්ණ දේශනයක් පවත්වනු ලැබුවේ ස්වීඩනයේ උප්සලා නුවර සත්ව අභිජනනය සහ ජාන විද්‍යාව පිළිබඳ ස්වීඩන් විශ්වවිද්‍යාලයේ උපකුලපති පේව තොරතුරු අධ්‍යයන අංශයේ මහාචාර්ය එරික් බොංකැම් රඩ්ලොෆ් විසිනි.

විවිධ පර්යේෂණ සම්මන්ත්‍රණ හතක් යටතේ විදේශීය හා දේශීයව සුප්‍රකට විශේෂඥයින් දහනව දෙනෙක් ඔවුන්ගේ විශේෂඥ ක්ෂේත්‍ර පිළිබඳව දේශන පැවැත්වූහ. සම්පූර්ණයෙන්ම මාර්ගගත සහ භෞතික දෙයාකාරයෙන්ම පැමිණීමට පහසුකම් සලසන මෙම සම්මන්ත්‍රණය දෙමුහුන් මාදිලියක් හරහා බෙදා හැරීම සැබවින්ම අද්විතීය විය. එය ඉතා සාර්ථක ලෙස ඉදිරිපත් කරන ලද අතර පැමිණි සිටි සැමගේ ඇගයීමට ලක් විය. එය ඉතා සාර්ථක උත්සවයක් වූ අතර විශාල පිරිසක් ඊට සහභාගී වූහ.



පුරාවිද්‍යාව ප්‍රවේණි විද්‍යාව හමුවෙයි: ජනගහන ප්‍රාග් ඉතිහාසයේ නව මංපෙත්" යන මාතෘකාව යටතේ ප්‍රධාන දේශනය පවත්වනු ලැබුවේ මහාචාර්ය රාජ් සෝමදේව විසිනි.




IBMBB වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ පවත්වන අතර සෑම වසර 5 කට වරක් ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණයක් පවත්වයි.

විවෘත දිනය

IBMBB සිය අතථ්‍ය විවෘත දිනය 2022 ඔක්තෝබර් 14 වන දින, සිසුන් සහ පර්යේෂකයන් 100කට වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. මෙම උත්සවය සූම් වේදිකාව හරහා සිදු කරන ලදී. මහාචාර්ය ප්‍රසන්න ගල්හේන, මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති, මහාචාර්ය ජගත්ප්‍රිය වීරසේන, මහාචාර්ය සමීර සමරකෝන්, සහ මහාචාර්ය සිසිර පතිරණ විසින් නායකත්වය දෙන ලදී.

සහභාගිවන්නන්ට විද්‍යාපති වැඩසටහන් සහ කෙටි පාඨමාලා හඳුන්වා දීම සඳහා IBMBB හි ගෞරවනීය විද්‍යාඥ මණ්ඩලය සමඟ එක්ව සිටියහ. අතිරේක නවෝත්පාදන සහ කාර්මික සාකච්ඡා වෛද්‍ය ගීතානි (පරීක්ෂණාගාර ප්‍රධානී, Lanka Hospital Diagnostics Pvt. Ltd.) විසින් ලබා දෙන ලදී.

තෙන්නකෝන් මහතා (පර්යේෂණ හා සංවර්ධන ප්‍රධානී, Link Natural Products Pvt. Ltd.), චමේන්ද්‍ර මහතා (FADNA Food and Nature Pvt. Ltd. නිර්මාතෘ), ආචාර්ය මුදිත (පර්යේෂණ ප්‍රධානී, John Keells Holdings) ද මීට එක්ව සිටියහ. කාර්ය සාධනය සාර්ථකව අවසන් වූ අතර, උත්සවය සඳහා සිසුන්ගේ ප්‍රතිචාරය විශිෂ්ට විය.



මෙම උත්සවය සූම් හරහා සිදු කරන ලද්දේ මහා. ප්‍රසන්න ගල්හේන, මහා. ශිරෝමා හඳුන්නෙත්ති, මහා. ජගත්ප්‍රිය වීරසේන, මහා. සමීර සමරකෝන්, සහ මහාචාර්ය සිසිර පතිරණගේ සහභාගිත්වයෙනි.



IBMBB සිය අතථ්‍ය විවෘත දිනයක් 2022 ඔක්තෝබර් 14 වන දින, සිසුන් සහ පර්යේෂකයන් 100කට වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. කාර්ය සාධනය සාර්ථක සටහනකින් අවසන් වූ අතර, ඒ ගැන සිසුන්ගේ ප්‍රතිපෝෂණය විශිෂ්ට විය

මූල්‍ය බාධා

2022 ක්‍රියාකාරී සැලැස්මේ සහ 2022-2026 ආයතනික/ උපායමාර්ගික සහ කළමනාකරණ සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා 2022 දී මූල්‍ය සම්පත් ප්‍රධාන බාධාවක් විය. ආයතනය විසින් රුපියල් මිලියන 168 ක ප්‍රාග්ධන වියදමක් ඇස්තමේන්තු කර තිබූ අතර සැබෑ වියදම රජයේ ප්‍රාග්ධන වාරණ ප්‍රදානයට (මිලියන 4.443) සීමා කිරීමට සිදු විය. තවද, IBMBB හට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අනෙකුත් පීඨ සඳහා ලබා ගත හැකි පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙතින් පර්යේෂණ සඳහා අරමුදල් ලැබී නොමැත. (නි/ මූ)

එබැවින් 2022 වර්ෂය තුළ ප්‍රාග්ධනය, පර්යේෂණ සහ සංවර්ධනය සම්බන්ධ සැලසුම් සහගත ක්‍රියාකාරකම් සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස අඩු වී ඇත.

ඉගෙනුම

- බාහිර උපාධි අපේක්ෂක වැඩසටහන ආරම්භ කිරීම
- ඖෂධ පෙව රසායනය පිළිබඳ නව පශ්චාත් උපාධි වැඩසටහනක් ආරම්භ කිරීම
- දැනට පවතින දර්ශනපති / දර්ශනසූරී වැඩසටහන් අඛණ්ඩව පවත්වා ගැනීම / ශක්තිමත් කිරීම
- නව කෙටි පාඨමාලා සැලසුම් කිරීම
- පවතින කෙටි පාඨමාලා ශක්තිමත් කිරීම
- ඉගැන්වීම, ඉගෙනීම සහ ඇගයීම් පිළිබඳ ද්විවාර්ෂික ශිෂ්‍ය ප්‍රතිපෝෂණය ශක්තිමත් කිරීම
- ශිෂ්‍ය උපදේශන වැඩසටහන ශක්තිමත් කිරීම
- පීඨයේ විස්තීර්ණ සම්පත් සංචිතයක් ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම
- ඉගැන්වීමේ ඉගෙනුම් ඇගයීම් ඉගෙනුම් ප්‍රතිඵල සමඟ පෙළගැස්වීම
- නවීන ඉගැන්වීම් / ඉගෙනුම් ක්‍රම ශක්තිමත් කිරීම
- නව ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රියාකාරකම් හඳුන්වාදීම/ අඛණ්ඩව පවත්වා ගැනීම (උදා: Coursera, PBL, SDL)

පර්යේෂණ

- ජාතික වශයෙන් අදාළ ප්‍රධාන පර්යේෂණ තේමා තුනක් යටතේ පර්යේෂණ ශක්තිමත් කිරීම
- පර්යේෂණ ක්‍රියාකාරකම්වල කාලානුරූප ප්‍රගතිය සමාලෝචනය කිරීමට සුදුසු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම
- කර්මාන්තය සමඟ පවතින සහයෝගීතා පැවරුම් නව ස්ථාපිත කිරීම සහ ශක්තිමත් කිරීම
- පර්යේෂණ ආයතන/පෞද්ගලික අංශයේ ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම
- සම්පූර්ණ පේටන්ට් අයදුම්පත් සහ හෙළිදරව් නොකිරීමේ ගිවිසුම්
- පර්යේෂණ සොයාගැනීම් වාණිජකරණය කිරීම
- සෞඛ්‍ය අංශය සමඟ සහයෝගීතා පර්යේෂණ වැඩසටහන් ශක්තිමත් කිරීම
- ආචාර්ය උපාධි වැඩසටහන් වල විෂය පථය පුළුල් කිරීම
- දර්ශනපති / දර්ශනසූරී වැඩසටහන් සඳහා නව ඇතුළත් කිරීම්, අණුක ජීව විද්‍යාවන්හි යෙදීම් පිළිබඳ වෘත්තිකයන්/තාක්ෂණ ශිල්පීන් පුහුණු කිරීම
- පර්යේෂණ වැඩසටහන් හරහා නව දැනුම උත්පාදනය කිරීම
- පීඨ සාමාජිකයින්/ සහකාරකයින් විසින් ජාතික/ජාත්‍යන්තර තරඟකාරී පර්යේෂණ ප්‍රදාන ලබා ගැනීමට දිරිමත් කිරීම සහ සහාය වීම
- අනෙකුත් පීඨ/විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශයේ අධ්‍යාපන ආයතන සමඟ සහයෝගීතාව ශක්තිමත් කිරීම
- දැනුම / පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීම

සේවා

- කර්මාන්ත/පෞද්ගලික අංශය සමඟ සහයෝගිතාව වර්ධනය කිරීම
- අදාළ සමාජ කොටස් ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම
- ජීව විද්‍යාව/තාක්ෂණ විෂය ධාරාවෙන් පසුවන උසස් පෙළ සිසුන් ඉලක්ක කරගනිමින් ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාකාරකම් පොහොසත් කිරීම
- වාර්ෂික ලේ දන්දීමේ කඳවුරක් සංවිධානය කිරීම
- අපේක්ෂා රෝහලේ සිදුකරන වාර්ෂික උත්සවය
- සම්පත් සීමිත උසස් පෙළ සිසුන් ඉලක්ක කර ගනිමින් වාර්ෂික පාසල් වැඩසටහන පැවැත්වීම
- ජීව විද්‍යාත්මක දත්ත සමුදායේ දර්පණ නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම
- පෙවතොරතුරුවේදය පදනම් වූ ඉගෙනීම/පර්යේෂණ සඳහා මාර්ගගත මෙවලම් සැපයීම
- අණුක ජීව විද්‍යා ක්ෂේත්‍රයේ ගමන් මග පිළිබඳ ලේඛනාගාර ගබඩාවක් පිහිටුවීම
- පිළිකා, වෙනත් රෝග සහ වැවිලි අංශය සඳහා රෝග විනිශ්චය සේවා
- උපදේශන
- ගාස්තු අයකරන පශ්චාත් උපාධි සහ අනෙකුත් පුහුණු වැඩසටහන්
- අණුක ජීව විද්‍යාව, ප්‍රතිශක්ති විද්‍යාව, පෙව තොරතුරු විද්‍යාව සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල යෙදීම් සම්බන්ධයෙන් වෘත්තිකයන් සහ තාක්ෂණවේදීන් පුහුණු කිරීම

ජාත්‍යන්තර ප්‍රමිතීන් පවත්වාගෙන යාම

- විදේශයන්හි විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන සමඟ පවත්නා/ නව සහයෝගිතා වැඩිදියුණු කිරීම
- ජාතික හා කලාපීය වශයෙන් අණුක ජීව විද්‍යාව, ප්‍රතිශක්ති විද්‍යාව, පෙව තොරතුරු හා අනුබද්ධ ක්ෂේත්‍ර පිළිබඳ පුහුණුව ලබා දීම.
- වර්තමාන සහ අනාගත ඉල්ලීම්වලට විසඳුම් ලබා දෙමින් නව රසායනාගාර ස්ථාපිත ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අත්පත් කර ගැනීම සහ වැඩිදියුණු කිරීම
- පෙව තොරතුරු විද්‍යාවේ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ගුරුවරුන් සහ විද්‍යුත් සම්පත් සඳහා ජාත්‍යන්තර විශිෂ්ටතා මධ්‍යස්ථාන සමඟ සම්බන්ධතා ඇති කිරීම
- බාහිර සමාලෝචන පද්ධතියක් ස්ථාපිත කිරීම
- විද්‍යාත්මක සහ පෙව වෛද්‍ය පර්යේෂණවල සදාචාරාත්මක භාවිතයන්
- ජාන පර්යේෂණ සහ ජානමය තොරතුරු වල සදාචාරාත්මක, සමාජීය සහ නීතිමය ඇඟවුම්
- ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණයක් පැවැත්වීම
- IBMBB හි සිදු කරන ලද පර්යේෂණ ඉදිරිපත් කිරීම සඳහා ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලට සහභාගී වීමට ආචාර්යවරුන් හා සිසුන් දිරිමත් කිරීම / සහාය වීම

පාලනය

- පුහුණු ප්‍රතිපත්තියක් සහ මාර්ගෝපදේශ සකස් කිරීම
- කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා ආචාර ධර්ම පද්ධතිය
- ගිණුම්කරණ ප්‍රමිතීන්හි පිළිගත් සම්මතයන්ට අනුකූල වීම
- පරිපාලන කටයුතු සඳහා SOP අත්පොත සකස් කිරීම
- කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා නිතිපතා පුහුණුව ලබා දීම

තිරසාර සංවර්ධනය මත පදනම්ව පරිසරය සුරැකීමට සහ පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමට ක්‍රියාකාරකම් පිළිබඳ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව

කොළඹ විශ්වවිද්‍යාලයේ පේවරසායන, අණුක පේවවේද සහ පේවතාක්ෂණ ආයතනය (IBMBB) යනු පේවරසායන විද්‍යාව, අණුක පේවවේදය, පේව තාක්ෂණය, ප්‍රතිශක්තිවේදය, පේවතොරතුරුවේදය සහ වෙනත් සම්බන්ධිත විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ පුහුණුව, පර්යේෂණ හා සංවර්ධනය සහ උපදේශනය සැපයීමේ අදහසින් පිහිටුවන ලද ආයතනයකි. පේවරසායන, අණුක පේවවේද සහ පේවතාක්ෂණ ආයතනය එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධනයේ ඉලක්කයන් අතරින් සිව්වන ඉලක්කය වන ගුණාත්මක අධ්‍යාපනයට සෘජුවම දායක වන අතර පරිසර සුරක්ෂිතතාවය සහ අහිතකර පාරිසරික බලපෑම් අවම කිරීම සඳහාද ආයතනය සැලකිල්ල යොමු කර ඇත.

කඩදාසි භාවිතය අවම කිරීම

IBMBB කඩදාසි භාවිතය අවම කිරීම සඳහා කඩදාසි මත පදනම් වූ ලේඛන ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. දැනට, අංශ අතර සිදුවන කාර්ය සමුදාය MS Teams මගින් සිදු කරනු ලබන අතර, වැඩ ප්‍රතිඵල වැඩි දියුණු කිරීම සහ කඩදාසි භාවිතය අඩු කිරීම සිදු කෙරේ. ස්වයං සේවා ද්වාරය (SSP) 2022 දී ක්‍රියාත්මක කරන ලද්දේ මාර්ගගත යෙදුම් පද්ධතිය සහ මාර්ගගත ගෙවීම් ද්වාරය කාර්ය මණ්ඩල/ශිෂ්‍ය පිවිසුම් පද්ධතියක් සමඟ ඒකාබද්ධ කිරීමෙනි. පාඨමාලා අයදුම්පත් සහ ගෙවීම් මාර්ගගතව සැකසීම පද්ධතිය හරහා කඩදාසි භාවිතය අඩු කිරීම සහ එදිනෙදා වැඩවල කාර්යක්ෂමතාව වැඩි කිරීම සිදු කෙරේ. IBMBB සඳහා ලේඛන කළමනාකරණ පද්ධතිය 2023 දී හඳුන්වා දීමට සැලසුම් කර ඇත. තවද, ආයතනය තුළ කඩදාසි සහ ටෝනර් භාවිතය අවම කිරීම සඳහා අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනයන්හිදී විද්‍යුත් තැපෑල භාවිතා කරනු ලැබේ.

පොලිතින් මුක්ත කලාපය

පේවරසායන, අණුක පේවවේද සහ පේවතාක්ෂණ ආයතනය පොලිතීන් වලින් නිදහස් වූ කලාපයක පිහිටුවා ඇති අතර ඉදිරියටත් ආයතනය එය එසේ පවත්වාගැනීමට කටයුතු කර ඇත.

අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය

කොළඹ විශ්වවිද්‍යාලයේ පේවරසායන, අණුක පේවවේද සහ පේවතාක්ෂණ ආයතනය තුල පශ්චාත් උපාධි ඉගැන්වීමේ සහ පුහුණු කටයුතු සඳහා පිහිටුවනු ලැබූ නවීන විද්‍යාගාර ඇති අතර එම විද්‍යාගාර තුල මිනිස් ලේ සාම්පලයන් සහ සෛල භාවිතයෙන් සිදුකරන පර්යේෂණ වලදී අවශ්‍ය නිසි ආරක්ෂක ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබේ. හානිදායක පේව අපද්‍රව්‍යයන් ඉවත දැමීම සහ පරිහරණය කිරීම සම්මත ආරක්ෂක ක්‍රමවේදයන්ට අනුකූලව සිදුකරගෙන යනු ලබයි. අනතුරුදායක රසායනික ද්‍රව්‍ය හා ප්‍රතික්‍රියාකාරක භාවිතයේදී හා බැහැර කිරීමේදී පාරිසරික අවදානම අවම කිරීමට අවශ්‍ය සියලු පියවර ගෙන ඇති අතර ඒවා ඉදිරි වර්ෂයේදීත් එම ආකාරයෙන්ම නිසි පරිදි ක්‍රියාත්මක කරනු ඇත.

පරිසර හිතකාමී ආලෝක උපාංග වෙත යොමුවීම

2024 වන විට සම්ප්‍රදායික විදුලි සැපයුම් වලට වඩා ෆ්ලෝරසන්ට් වැනි ශක්ති පිරිමැසුම් සහ පාරිසරික මිත්‍රශීලී LED ආලෝක උපාංග වෙත යාමට සැලසුම් කර ඇත. එහි විෂ මූල ද්‍රව්‍යයන් අඩංගු නොවන නිසා අපතේ යන ද්‍රව්‍ය පොළොව ගොඩකිරීම සඳහා බෙදීමේදී පාරිසරික දූෂණයන් LED බල්බ මගින් සිදුනොවේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එවිඊඩී/බී/අයිබීඑමබීබී/2022/එෆ්ඒ/04

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 04 දින



අධ්‍යක්ෂ,
ජෛවරසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ **2022** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **12** වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ගොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් -

1. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය,
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය.
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.
4. උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	එච්ඒඩ්/බී/අයිබීඑම්බීබී/2022 එෆ්/ඒ/04	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2023 අප්‍රේල්30 දින

අධ්‍යක්ෂ,

පෙවරසායන අණුක පෙව්වේද හා පෙව තාක්ෂණ ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පෙවරසායන අණුක පෙව්වේද හා පෙව තාක්ෂණ ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පෙවරසායන, අණුක පෙව්වේද හා පෙව තාක්ෂණ ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2003 අංක 1 දරන පෙවරසායන, අණුක පෙව්වේද හා පෙව තාක්ෂණ ආයතන නියමාවලියේ 17 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 43 වන ඡේදය අනුව ක්ෂය වන වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය වෙනස්වීම ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනසක් ලෙස ගැලපීම් කළයුතු වුවද ආයතනය සමාලෝචිත වර්ෂයේදී මෝටර් රථ ක්ෂය අනුපාතය සියයට 10 සිට සියයට 20 දක්වා වැඩි කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීමක් ලෙස අතීතානුයෝගීව ගැලපුම්කර තිබුණි. ඒ අනුව වර්ෂයට අදාල රු.515,500 ක් වූ මෝටර් රථ ක්ෂය සහ 2022 දෙසැම්බර් 31 දිනට රු. 2,062,001 ක් වූ මෝටර් රථ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂිත වෙනස්වීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද, තවදුරටත් භාවිතාකරන සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති පිරිවැය රු. 48,862,850 ක් වූ පරිගණක, විද්‍යාගාර උපකරණ හා පුස්තකාල පොත් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට විදේශ ව්‍යවහාර බැංකු ගිණුමේ ඇමරිකානු ඩොලර් 25,726 ක් වූ ශේෂය එදිනට පැවති විදේශ විනිමය අනුපාතය අනුව ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් රු.897,615 ක් වූ විදේශ විනිමය හුවමාරු ලාභය මූල්‍ය ප්‍රකාශනවලට ගැලපුම් කර නොතිබුණි.

(ඈ) පාඨමාලා ආදායමෙන් අරමුදල් 4 කට සිදුකර තිබූ රු.10,290,805 ක් වූ මාරු කිරීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ වර්ෂය අවසානයේදී ලාභයෙන් සිදුකරන විසර්ජනයන් ලෙස දැක්වීම වෙනුවට ඍජුවම ආදායමෙන් අඩු කර දක්වා තිබීම නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ

පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරනලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති රීති / විධානයට යොමුව	නිරීක්ෂණය
(අ)	1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා 2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය	විදේශ ප්‍රදාන හා ශිල්පීය ආධාර විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවයෙන් තොරව 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ලැබී තිබුණු එකතුව රු.8,923,951 ක් වූ විදේශ ප්‍රදාන ආයතනය වෙත සෘජුව ලබා ගැනීමට කටයුතු කර තිබුණි.
(ආ)	2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 4.2 වගන්තිය	ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පූර්ණකාලීන උපාධි පාඨමාලා 4 ක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 අනෙකුත් කරුණු

ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය අනුව තාවකාලික විද්‍යාත්මක සහකාර (කොන්ත්‍රාත් පදනම මත) තනතුරු 2 ක් පමණක් අනුමත වී තිබියදී එම තනතුර සඳහා 07දෙනෙකු බඳවා ගෙන තිබීම නිසා කාර්යමණ්ඩලය 05 දෙනෙකු අතිරික්තව පැවතුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය
உயிர் இரசாயனவியல் மூலக்கூற்று உயிரியல் மற்றும் உயிர்த் தொழில்நுட்பவியல் நிறுவகம், கொழும்பு பல்கலைக்கழகம்
Institute of Biochemistry, Molecular Biology and Biotechnology, University of Colombo

90, කුමාරතුංග මුනිදාස මාවත,
කොළඹ 03, ශ්‍රී ලංකාව.
90, குமாரதுங்க முனிதாச மாவத்தை,
கொழும்பு 03, இலங்கை.
90, Cumaratunga Munidasa Mawatha,
Colombo 03, Sri Lanka.
www.ibmbb.cmb.ac.lk

2023.05.11

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

උක්ත හිසින් ඔබ විසින් එවන ලද අංක එච්ඊඩී/බී/අයිබීඑම්බීබී/2022/එෆ්ඒ/04 හා සම්බන්ධවයි. එම යථෝක්ත වාර්තාවේ සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් අදාල තොරතුරු මේ සමඟ අමුණා එවමි.

ස්තුතියි

මහාචාර්ය ප්‍රසන්න ගල්හේන
අධ්‍යක්ෂ,
ජෛවරසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

පිටපත් :

1. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය

දූරකථනය
தொலைபேசி
Telephone
011 2552528
E-mail : info@ibmbb.cmb.ac.lk

Director :
Tel. : 011 2552534
Fax : 011 2552529
E-mail : director@ibmbb.cmb.ac.lk

Senior Assistant Registrar :
Tel. : 011 2553672
Fax : 011 2553683
E-mail : sar@ibmbb.cmb.ac.lk

Deputy Bursar :
Tel./ Fax : 011 2553683
E-mail : db@ibmbb.cmb.ac.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 27 ඡේදය අනුව ක්ෂය අනුපාතය වෙනස්වීම ප්‍රතිපත්ති වෙනසක් ලෙස හඳුනා ගෙන අතීතානුයෝගීව ගැළපුම් කරන ලදී. විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි එය ගිණුම්කරණ ඇස්තමේන්තුවක් ලෙස සළකා ප්‍රමිති ප්‍රකාරව 2023 වර්ෂයේදී සිදුකිරීමට පියවර ගනු ලබන අතර ම සංසන්දනාත්මක අගයන් ද හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) විගණනය විසින් පෙන්වා දී ඇති නිරීක්ෂණ සමඟ එකඟ වන අතර 2023 වර්ෂයේදී සම්පූර්ණයෙන් ක්ෂය වී අවසන් දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව 2023 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙළ කිරීමේදී කටයුතු කරනු ලැබේ.

(ඇ) විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ. 2023 වර්ෂයේදී ගිණුම් පිළියෙළ කිරීමේදී විදේශ හුවමාරු ලාභය නිසි පරිදි ගැළපීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ. කෙසේ වෙතත් සංවර්ධන අරමුදල, අධ්‍යක්ෂ වැය, උපකරණ හා තාක්ෂණ වැය හා පාඨමාලා සංවර්ධන වැය වලට වෙන්කළ යුතු මුදල යෘජුවම ආදායමෙන් අඩු කිරීම සමාලෝචිත වර්ෂයේ අතිරික්තය කෙරෙහි බලපෑමක් ඇති නොකරයි. විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි එම වැය විෂයන් සඳහා සිදුකරන වෙන්කිරීම් 2023 වර්ෂයේ සිට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය හරහා සිදු කිරීමට පියවර ගනු ලැබේ.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2

(අ) පෙර වර්ෂවල සිටම අප ආයතනය වෙත පර්යේෂණ සඳහා විදේශ ප්‍රදාන ලැබීමේදී මහා භාණ්ඩාගාරය විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා පැමිණ නොමැත. කෙසේ වුවත් විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි පර්යේෂණ ප්‍රදාන සම්බන්ධයෙන් 30/94 දරණ රාජ්‍ය ගිණුම්කරණ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට මින් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ආ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පූර්ණ කාලීන උපාධි පාඨමාලා 4 සඳහා අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලිය අප ආයතනය විසින් ආරම්භ කොට ඇත. අප විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අනුමැතිය සඳහා වන අයදුම්පත්‍ර ප්‍රථම වටයේ ඇගයීමෙන් පසුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සුළු සංශෝධනයන් (Minor Changes) සඳහා අප වෙත එවා ඇත. එම යෝජිත සංශෝධනයන් අධ්‍යයන මණ්ඩල (Board of Studies) වලට යොමු කොට 2023 අප්‍රේල් මාසය තුළදී නැවතත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කිරීමට නියමිතය.

2.3 අනෙකුත් කරුණු

(අ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය අනුව තාවකාලික විද්‍යාත්මක සහකාර (කොන්ත්‍රාත් පදනම මත) (on contract basis) තනතුරු 02ක් අනුමත අතර ඔවුන්ට භාණ්ඩාගාර අරමුදලින් ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ. පැවරුම් පදනම මත තාවකාලික විද්‍යාත්මක සහකාර (Scientific Assistant – on assignment basis) 05ක් බඳවා ගෙන ඇති අතර ඔවුන්ට උපාය ගත් ආදායමෙන් ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ.

ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයෙහි පශ්චාත් උපාධි සහ දර්ශන විශාරද උපාධි පිරිනමන ආයතනයක් වන අතර අණුක ජෛවවිද්‍යා, සෛල හා අණුක ප්‍රතිශක්තිවේද හා ජෛව තොරතුරුවේද යන විෂයයන් පථ තුන ඔස්සේ අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සිදු කරයි.

මෙම අධ්‍යයන හා පර්යේෂණ කටයුතු ඵලදායීව, නිසි වේලාවට පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය කරුණකි. ආයතනය තුළ මෙම අධ්‍යයන අංශ තුනෙහි පවතින අධ්‍යයන හා පර්යේෂණ කටයුතු ධාරිතාව මත පදනම්ව උපාය ගත් ආදායමෙන් ගෙවීම් කටයුතු කිරීම සඳහා අනුමත තාවකාලික විද්‍යාත්මක සහකාර තනතුරු 02ට (කොන්ත්‍රාත් පදනම මත) අමතරව පැවරුම් පදනම මත තාවකාලික විද්‍යාත්මක සහකරුවන් (Scientific Assistant – on assignment basis) 05ක් බඳවා ගෙන ඇත.

2022 වසරේ අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳ සමාලෝචනය

හැඳින්වීම

විගණන කමිටුව ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ පේව රසායන විද්‍යාව, අණුක ජීව විද්‍යාව සහ පේව තාක්ෂණ ආයතනයේ ප්‍රධාන කාරක සභාවකි. ත්‍රිපුද්ගල කමිටුව සෑම වසරකම කාර්තුමය වශයෙන් රැස්වන අතර විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ ආයතනයේ මූල්‍ය, පරිපාලන, මානව වත්කම් සහ අධ්‍යයන කටයුතු මගින් නිකුත් කරන ලද විගණන වාර්තා සහ විගණන විමසුම් සාකච්ඡා කරයි. එහි සාමාජිකත්වය, නිල කාලය, වගකීම්, බලතල සහ මැතිවරණ ක්‍රියා පටිපාටි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ කළමනාකරණ මණ්ඩලය හරහා ශ්‍රී ලංකා භාණ්ඩාගාරය මගින් පාලනය වේ.

විගණන කමිටුවේ සංයුතිය - 2022

සාමාජිකයන් / නිරීක්ෂකයන්	තනතුර
සාමාජිකයින්	
පද්මිණී රණාවීර මහත්මිය	සභාපති
මහාචාර්ය රමණී විජේසේකර	සාමාජික
කේ.පිරතීපන් මහතා	භාණ්ඩාගාර නියෝජිත
කැඳවුම්කරු	
කේ.ඊ.ඩබ්ලිව්. ජයසිරි	ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක/UOC
නිරීක්ෂකයින්	
මහාචාර්ය බී.පී.ගල්හේන	අධ්‍යක්ෂ/ IBMBB
මෙනවිය එස්.එම්.සී. ඉන්දික	විගණන අධිකාරී
එම්.එම්.ඉර්.ජේ. බෝගමුව මහතා	අභ්‍යන්තර විගණක / UGC

රැස්වීම්

රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/31 අනුව, කමිටුව වසරකට අවම වශයෙන් හතර වතාවක් රැස්විය යුතුය. සමාලෝචිත වර්ෂය තුළ කාරක සභාව සිව් වතාවක් රැස්වී ඇත.

අභ්‍යන්තර විගණනය

පේව රසායනවේදය, අණුක පේවවේදය සහ පේව තාක්ෂණවේද ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කර ඇත. 2022 විගණන සැලැස්මට ඇතුළත් කර ඇති පරිදි අභ්‍යන්තර විගණකවරුන් විසින් පශ්චාත්, පූර්ව සහ අනෙකුත් විගණන කටයුතු සිදු කර ඇත.

වර්ෂයේ අභ්‍යන්තර විගණන කාර්යය පිළිබඳ සභාපති/ විගණන කමිටුවේ සමාලෝචනය - 2022

කමිටු සාමාජිකයින්ගේ සක්‍රීය සහභාගීත්වය සහ ආයතනයේ යහපාලනය සඳහා ඔවුන්ගේ කැපවීම පිළිබඳව විගණන කමිටුව සෑහීමකට පත් විය. අභ්‍යන්තර විගණන අංශයේ අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳව කමිටුව සෑහීමකට පත් විය. කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශ සම්බන්ධයෙන් ගෙන ඇති පසු විපරම් ක්‍රියාමාර්ග සහ ලබා ඇති ප්‍රගතිය පිළිබඳව කමිටුව සෑහීමකට පත්වන අතරම, යහපාලනය, විනිවිදභාවය, නිසි මූල්‍ය, පරිපාලන සහ අධ්‍යයන කාර්ය සාධනය ක්‍රියාත්මක කිරීම පිළිබඳව දිගින් දිගටම අවධාරණය කරයි.



පද්මිණී රණාවීර මිය
සභාපති,
විගණන කමිටුව/ IBMBB UOC

2022 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ආසන්න රුපියලට ගලපා ඇත.)

	සටහන	2022 රු.	2021 පුනර්ප්‍රකාශිත රු.	% වෙනස
වත්කම්				
ප්‍රංගම වත්කම්				
මූල්‍ය හා මූල්‍ය පර්යාය	සටහන 1	15,513,824	19,415,189	(20)
වෙනත් ලැබිය යුතු දෑ	සටහන 2	5,505,426	2,866,070	92
අත්තිකාරම්	සටහන 3	3,197,599	70,063	4,464
කාර්ය මණ්ඩල ණය - වසර තුළ	සටහන 4	727,511	973,257	(25)
ආයෝජන - වසර තුළ කල්පිරෙන	සටහන 5	22,315,941	38,741,037	(42)
රසායන ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ		869,060	1,365,871	(36)
		48,129,362	63,431,486	(24)
ප්‍රංගම නොවන වත්කම්				
දේපළ පිරියත හා උපකරණ				
ගොඩනැගිලි	සටහන 6	23,388,928	29,228,161	(20)
පුස්. පොත් සහ වාර සඟරා		175,216	380,813	(54)
රසායනාගාර හා ඉගනුම් උප.		9,636,041	12,521,232	(23)
පරිගණක		4,395,381	5,830,391	(25)
කාර්යාල භාණ්ඩ හා උපකරණ		10,950,813	12,473,031	(12)
කාර්ය මණ්ඩල ණය - වසරකට වැඩි	සටහන 4	2,606,978	1,591,090	64
ආයෝජන - වසරකින් කල්පිරෙන	සටහන 5	66,716,482	37,373,172	79
		117,869,839	99,397,890	19
මුළු වත්කම්		165,999,200	162,829,376	2
බැරකම්				
ප්‍රංගම බැරකම්				
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	සටහන 08.1	-	9,774,675	(100)
ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතු		41,602	66,412	(37)
ආපසු ගෙවන රසායනාගාර තැන්පතු		7,272,635	5,992,635	21
උපචිත වියදම් සහ අනෙකුත් ගෙවීම්	සටහන 7	4,319,893	7,515,124	(43)
		11,634,131	23,348,847	(50)
ප්‍රංගම නොවන බැරකම්				
පාරිතෝෂික ප්‍රතිපාදන	සටහන 8	28,317,795	28,466,310	(1)
විගණන ගාස්තු ප්‍රතිපාදන		1,578,517	1,178,517	34
පර්යේෂණ ප්‍රදාන	සටහන 9	5,599,976	6,403,432	(13)
විලම්බිත ආදායම	සටහන 10	4,568,682	4,763,984	(4)
		40,064,969	40,812,243	(2)
මුළු බැරකම්		51,699,100	64,161,090	(19)
ශුද්ධ වත්කම් /කොටස්		114,300,100	98,668,286	16

2022 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
(ඉතිරිය..) (ආසන්න රුපියලට ගලපා ඇත.)

	සටහන	2022 රු.	2021 පුනර්ප්‍රකාශිත රු.	% වෙනස
සමුච්චිත අරමුදල් හා සංචිත				
සමුච්චිත අරමුදල්- ප්‍රාග්ධන	සටහන 19	37,386,217	49,711,196	(25)
සමුච්චිත අරමුදල් - පුනරාවර්තන		29,248,482	12,054,636	143
ප්‍රත්‍යාගණන අතිරික්තය/(හිඟය)		10,665,445	10,665,445	-
		77,300,144	72,431,277	7
නම්කළ අරමුදල්	සටහන 20			
ආයතන සංවර්ධන අරමුදල		14,631,203	10,040,598	46
අධ්‍යක්ෂ ශීර්ෂය		1,786,724	-	-
උපකරණ සහ තාක්ෂණ ශීර්ෂය		1,321,113	-	-
වැඩ සටහන් ශීර්ෂය		2,592,364	-	-
		20,331,405	10,040,598	102
සීමිත අරමුදල්				
පරිත්‍යාග අරමුදල්		4,003,310	3,531,171	13
වත්කම් ප්‍රතිස්ථාපන අරමුදල්		12,665,241	12,665,241	-
		16,668,551	16,196,412	3
		114,300,100	98,668,286	16

සකස් කර සහතික කළේ
23.02.2023

....

නි. මූල්‍යාධිකාරී ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

අංක 6 සිට 13 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 14 සිට 18 පිටුවල දැක්වෙන අනෙකුත් සටහන් මේ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය කොටසක් වේ. මේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය

....

මණ්ඩල සාමාජික අධ්‍යක්ෂ / මණ්ඩල සාමාජික

2022 දෙසැම්බර් 31 වනදායින් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

		2022 රු.	2021 පුනර්ප්‍රකාශිත රු.	% වෙනස
ආදායම්				
විනිමය නොවන ගණුදෙනුවලින් ආදායම් - ප්‍රංගම				
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය		115,830,000	110,926,897	4
වෙනත් පර්යේෂණ ප්‍රදානයන්	සටහන 11	1,302,333	2,745,408	(53)
විනිමය නොවන ගණුදෙනු 11කින් මුළු ආදායම - ප්‍රංගම		117,132,333	113,672,305	3
විනිමය ගණුදෙනුවලින් ආදායම් - ප්‍රංගම				
උත්පන්න ආදායම	සටහන 12	26,165,109	17,615,789	49
පොලී ආදායම		12,593,302	4,165,080	202
වෙනත් ආදායම්	සටහන 13	525,049	227,058	131
විනිමය ගණුදෙනුවලින් මුළු ආදායම - ප්‍රංගම		39,283,460	22,007,927	78
මුළු ආදායම - ප්‍රංගම		156,415,793	135,680,232	15
විනිමය නොවන ගණුදෙනුවලින් ආදායම් - ප්‍රාග්ධන				
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය		4,443,000	7,138,103	(38)
විනිමය නොවන ගණුදෙනුවලින් මුළු ආදායම් - ප්‍රාග්ධන		4,443,000	7,138,103	(38)
විනිමය ගණුදෙනුවලින් ආදායම් - ප්‍රාග්ධන		-	-	-
විනිමය ගණුදෙනුවලින් මුළු ආදායම් - ප්‍රාග්ධන		-	-	-
මුළු ආදායම - ප්‍රාග්ධන		4,443,000	7,138,103	(38)
මුළු ආදායම		160,858,793	142,818,335	13
මෙහෙයුම් වැය - පුනරාවර්තන				
සේවක පාරිශ්‍රමික	සටහන 14	97,639,112	92,807,849	5
ප්‍රවාහන		11,610	194,677	(94)
සැපයුම්	සටහන 15	10,821,785	8,618,940	26
නඩත්තු වියදම්	සටහන 16	9,384,775	3,511,029	167
කොන්ත්‍රාත් වැය	සටහන 17	15,071,664	14,829,997	2
වෙනත් පුනරාවර්තන වියදම්	සටහන 18	6,001,308	3,876,252	55
පාරිතෝෂික		4,268,116	8,297,720	(49)
ක්ෂය		-	2,005,891	(100)
මුළු මෙහෙයුම් වැය - ප්‍රංගම		143,198,369	134,142,354	7
මෙහෙයුම් නොවන වැය				
ක්ෂය		16,767,979	25,264,651	(34)
මුළු මෙහෙයුම් නොවන වැය		16,767,979	25,264,651	(34)
මුළු වැය		159,966,349	159,407,005	0
වර්ෂය සඳහා මුළු අතිරික්කය/ (හිඟය))		892,445	(16,588,670)	(105)
වර්ෂය සඳහා ප්‍රංගම අතිරික්කය/ (හිඟය)		13,217,424	1,537,878	759
වර්ෂය සඳහා ප්‍රාග්ධන අතිරික්කය/ (හිඟය)		(12,324,979)	(18,126,548)	(32)

2022 දෙසැම්බර් 31 වනදායින් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2022 රු.	2021 පුනර්ප්‍රකාශිත රු.	% වෙනස
වර්ෂය සඳහා අතිරික්කය	892,445	(16,588,670)	(105)
එකතුකළා : අරමුදල් සංචලනයක් නැති අයිතම සඳහා ගැලපීම			
පාරිතෝෂික ප්‍රතිපාදන	4,268,116	8,297,720	(49)
රඳවාගත් ඉපැයුම්වලට ගැලපීම්	9,851	(754,590)	(101)
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	400,000	400,000	-
ක්ෂය	16,767,979	27,270,542	(39)
වත්කම් බැහැර කිරීමෙන් ලද පාඩුව	-	39,094	(100)
සීමිත අරමුදල් සඳහා ප්‍රතිපාදන	10,762,946	2,145,776	402
කොටස් ගැලපීම අවතක්සේරු කිරීම	-	31,670	(100)
කාරක ප්‍රාග්ධන වෙනසට පෙර මෙහෙයුම් අතිරික්තය	33,101,337	20,841,542	59
කාරක ප්‍රාග්ධන වෙනස			
අනෙකුත් ලැබිය යුතු දේවල (වැඩි වීම)/අඩුවීම	(2,639,356)	1,991,396	(233)
අත්තිකාරම් (වැඩි වීම)/අඩුවීම	(3,127,536)	(56,638)	5,422
කාර්ය මණ්ඩල ණය (වැඩි වීම)/අඩුවීම	(770,143)	784,488	(198)
රසායන ද්‍රව්‍ය සහ විදුරු භාණ්ඩ(වැඩි වීම)/අඩුවීම	496,810	2,324,609	(79)
ආපසු ගෙවියයුතු රසායනාගාර තැන්පතු වැඩිවීම/(අඩුවීම)	(24,810)	-	-
ආපසු ගෙවියයුතු රසායනාගාර තැන්පතු වැඩිවීම/(අඩුවීම)	1,280,000	1,518,062	(16)
උපචිත වියදම් සහ අනෙකුත් ගෙවිය යුතු දේවල වැඩිවීම/(අඩුවීම	(3,195,231)	693,035	(561)
පර්යේෂණ ප්‍රදාන වැඩිවීම/(අඩුවීම)	(803,456)	(1,306,581)	(39)
විලම්බිත ආදායම වැඩිවීම/(අඩුවීම)	(195,302)	3,732,757	(105)
ගෙවූ විගණන ගාස්තු	-	(510,000)	(100)
ගෙවූ පාරිතෝෂික	(10,224,734)	(913,842)	1,019
	(19,203,759)	8,257,287	(333)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	13,897,578	29,098,829	(52)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහයන්			
ආයෝජන (වැඩිවීම)/අඩුවීම	(12,918,214)	(23,098,572)	(44)
ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම	(4,880,728)	(4,422,459)	10
ප්‍රතිස්ථාපන අරමුදලෙන් මිලදී ගත් වත්කම්	-	(219,888)	(100)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	(17,798,942)	(27,740,919)	(36)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහයන්			
බැහැර කිරීම් විකිණීමෙන් ආදායම්	-	28,750	(100)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහයන්	-	28,750	(100)
මූල්‍ය හා මූල්‍ය පර්යායයන්හි ශුද්ධ වැඩිවීම	(3,901,365)	1,386,659	(381)
